අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

# 2019
# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# ANNUAL REPORT

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
அரசாங்க அச்சகக் கூட்டுத்தாபனம்
State Printing Corporation

වාර්ෂික වාර්තාව,
ගිණුම් ප්‍රකාශන
සහ
විගණකාධිපතිගේ වාර්තාව

# රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

# 2019
# වාර්ෂික වාර්තාව

2019 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ 52 වෙනි වසර සඳහා

2019 ජනවාරි මස 01 වෙනි දින සිට
2019 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා

මුද්‍රණය : රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

# දැක්ම

මුද්‍රණයේ විශිෂ්ටත්වය තුළින්
අපගේ පාරිභෝගිකයන්ගේ හා පාර්ශවකරුවන්ගේ
චින්තනයේ සහ තේරීම තුළ
ප්‍රමුඛයා බවට පත්වීම.

# මෙහෙවර

උගත් සහ මනා කැපවීමක් සහිත
ශ්‍රම බලකායක් සමඟ අති නවීන තාක්ෂණය,
තත්ත්ව කළමනාකරණ,
පරිසරය හා බලශක්ති කළමනාකරණ පද්ධතීන් තුළින්
කාර්යක්ෂම, ඵලදායී සහ තිරසාර
මුද්‍රණ සංවර්ධනයක් උදෙසා කැපවෙමු.

පානළුව,
පාදුක්ක.

ගරු අධ්‍යාපන අමාත්‍යතුමා
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල.

ගරු ඇමතිතුමනි,

1971 අංක 38 දරන මුදල් පනතේ 14 වෙනි වගන්තියේ කොන්දේසිවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2019 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදය ආවරණය කෙරෙන,

01. රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාව
02. ගණන් පරීක්ෂණයට භාජනය කරන ලද මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය හා විස්තීරණ ආදායම් ප්‍රකාශය ඇතුළු මූල්‍ය ප්‍රකාශන
03. විගණකාධිපතිවරයාගේ අදහස් දැක්වීම

ඔබතුමාගේ දැන ගැනීම සඳහා මේ සමග ඉදිරිපත් කරමි.

මෙයට - විශ්වාසී

**ජනක රත්නකුමාර**
සභාපති
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව



# සභාපතිතුමාගේ පණිවිඩය

**රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව 2019 වාර්ෂික වාර්තාව සඳහා පණිවුඩයක් ඉදිරිපත් කිරීමට වසරක කාලයක් තුළ ආයතනය තුළ සභාපති ලෙස වැඩ කිරීම මඟින් ලබාගත් අත්දැකීම් හා එම වසර තුළ වසර 4කට පසු නැවතත් ලාභදායී ආයතනයක් බවට පරිවර්තනය කිරීමට ලැබීම මා ලත් භාග්‍යයක් ලෙස සලකන්නෙමි.**

1968 අංක 24 දරණ පනත ප්‍රකාරව ආරම්භ කරන ලද රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව පුරා වසර 53ක් තිස්සේ විවිධ අභියෝග මධ්‍යයේ වර්තමාන ප්‍රගමනය කරා පැමිණ ඇත.

පසුගිය වසර 5ක අතීතය දෙස සසඳා බැලීමේදී රු. මි. 900කට වඩා මූල්‍යමය පාඩුවක් 2016 වසර සිට 2019 වසර දක්වා පැවති අභියෝගාත්මක අවස්ථාවක 2020.01.01 දින මා මෙම සංස්ථාවේ සභාපති වරයා ලෙස පත්වීම් ලදිමි. ඒ තත්ත්වය එසේ තිබියදී වර්තමාන ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව සේවයේ පිහිටුවමින් 2020 වසර තුළ රු. මි. 22කට වඩා ලාභයක් ලබාගනිමින් රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව නැවතත් සෞභාග්‍ය ගමනක් කරා ළඟා කර ගැනීමට මා හට හැකි වීම පිළිබඳව මම ඉතාමත් සතුටට පත් වෙමි.

තවද, 2020 වසර රජයේ මුද්‍රණ නීතිගත සංස්ථා ඉතිහාසයේ වාර්තාගත ආදායම් ඉපැයූ වර්ෂයක් ලෙසත් එය රු. මිලියන 1800කට වැඩි ආදායමක් ලබා ගැනීම මඟින් සනිටුහන් කරන ලදී.

මෙය රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ අනාගතය තිරසාර සංවර්ධන මාවතකට යොමු කරලීමට හැකි වන හැරවුම් ලක්ෂයක් බවට පත්වීම නොඅනුමානය.


2020 වසර තුළ ඉහතින් සඳහන් කළ පරිදි මූල්‍යමය වශයෙන් ලාභදායී රාජ්‍ය ආයතනයක් බවට පත් කිරීමටත් ඉතිහාසයේ වාර්තාගත ආදායමක් ඇතිකර ගැනීමටත් අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගෙන් ලද දැක්මත් ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආශිර්වාදය හා සහයෝගයත් ගරු අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් මැතිතුමාගේ සහ අධ්‍යාපන ලේකම් මහාචාර්ය කපිල පෙරේරා මහතාගේ ලද උපදෙස් හා මඟ පෙන්වීම මෙම ජයග්‍රහණය සඳහා නොමද පිටිවහලක් විය.

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව ඉදිරි වසර හතර තුළ රාජ්‍ය ක්ෂේත්‍රයේ පවත්නා ලාභ ලබන ආයතනයක් බවට පත් කරමින් එහි සාමාජිකයන්ගේ මානව ඵලදායීතාව ප්‍රවර්ධනය කිරීම මාගේ ඒකායන අරමුණ වන අතර ජාත්‍යන්තර වශයෙන් සම්මත කරන ලද ප්‍රමිතිකරණයන් ලබා ගැනීමටත් පරිසර හිතකාමී අයුරින් අප කර්මාන්ත ශාලාව හරිත කර්මාන්ත ශාලාවක් බවට පරිවර්තනය කිරීමටත් පුනර්ජනනීය බලශක්තිය මඟින් අවශ්‍ය විදුලිය ලබාගෙන කාබන් ශූන්‍ය කර්මාන්තකරණයක් බවට පරිවර්තනය කිරීමත් ඉදිරි වසර දෙක තුළ මාගේ උපාය මාර්ග සැලැස්මට ඇතුළත් කර ඇත.

ඉදිරි දශකය තුළ මුද්‍රණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා ලෙස විරාජමාන වෙමින් වෙළඳපොළ අවශ්‍යතා ලබාදීම අප හමුවේ ඇති ප්‍රධාන අභියෝගයක් වී ඇත. එම අභියෝගවලට සාර්ථකව මුහුණ දී ඒවා ජයගැනීම සඳහා අනාගතයට ගැළපෙන අයුරින් නවීන යන්ත්‍ර සූත්‍ර එනම් සුරක්ෂා මුද්‍රණ යන්ත්‍රය, නව පෙළ පොත් මුද්‍රණ යන්ත්‍රය හා අති නවීන සිව්වර්ණ මුද්‍රණ යන්ත්‍රයක්ද මෙම වසර තුළ ලබා ගැනීමට හැකි වීම හා ජාත්‍යන්තර ප්‍රමිතිකරණයක් වන ISO-9001-2015 සහ ISO-14051-2011 යන ප්‍රමිතිකරණයන් අප ආයතනය තුළ ස්ථාපිත කිරීම මඟින් ඉහත අභියෝගයට සාර්ථකව මුහුණ දීම සඳහා අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීමට හැකිවීම සභාපතිවරයා ලෙස මා ලද භාග්‍යයක් ලෙස සලකන්නෙමි.

නවීන ලෝකයට ගැළපෙන පරිදි ආයතනය තුළ නව ව්‍යාපාර සංවර්ධන අවස්ථාවන් ලෙස ඩිජිටල් මුද්‍රණ යන්ත්‍රයන් ස්ථාපිත කිරීමත්, SPC ඩිජිටල් ලෝයල්ටි කාඩ් පත හඳුන්වා දීම හා SPC ඩිජිටල් නමින් App පත හඳුන්වා දීම මඟින් Smart Outlet සංකල්පය හඳුන්වා දීම මුද්‍රණ ක්ෂේත්‍රයෙන් ඔබ්බට ගොස් නව මානයක් ඔස්සේ ආයතනය සංවර්ධනය කිරීමට කටයුතු කර තිබීම ආයතනයේ අනාගතය උදෙසා සිදු කරන ලද ආයෝජනයක් වනු නොඅනුමානය.

මෙම වසර $1\frac{1}{2}$ ක් තුළ කරන ලද දැවැන්ත සංවර්ධන ක්‍රියාදාමය මඟින් ආයතනය තුළින් නිෂ්පාදනය කරන ලද පාසල් පෙළ පොත් නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව ඉහළ යාම අප ලද ජයග්‍රහණයක් වන අතර ලොතරැයි මුද්‍රණයට අමතරව සුරක්ෂා මුද්‍රණ කටයුතු සිදු කරනු ලබන ජාතික හා ජාත්‍යන්තර අවශ්‍යතාවයන්ට අවශ්‍ය වන සුරක්ෂා මුද්‍රණ කිරීමේ නව කර්මාන්ත ශාලාවක් ඇති කිරීම හා ඩිජිටල් මුද්‍රණය මඟින් හා සිව්වර්ණ මුද්‍රණය මඟින් අලුතින් ඇතිවන ආර්ථිකමය ප්‍රතිලාභයත් ආයතනයට අනාගතයේදී ලැබීමට සැලැස්වීමට හැකි වීම පිළිබඳව සභාපතිවරයා ලෙස මා ප්‍රීතියට පත්වන අතර නිලධාරී මහත්ම/මහත්මීන්ගෙන් හා සියලුම සේවක මහත්වරුන්ටත් ආයතනයේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් එක්ව වැඩ කළ යුතු බවට දන්වා සිටිමි.



**ජනක රත්නකුමාර**
සභාපති
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

# 2019

## අධ්‍යක්ෂ මණ්ඩලය

**සභාපති**

එච්. හේවගේ මහතා (2019. 01. 25 - 2019. 03. 28)
ආර්. එම්. එම්. රත්නායක මහතා (2019. 12. 04 - )
බිනර ජයවර්ධන මහතා (2019. 03. 29 - 2019. 12. 03)

**ක්‍රියාකාරී අධ්‍යක්ෂ**

මහින්ද පුෂ්පකුමාර මහතා (2019. 02. 12 - 2019. 12. 03)

**අධ්‍යක්ෂ**

1. කුමුදු මීගහගේ මහතා
2. ජයන්ත වික්‍රමනායක මහතා
3. විජිත නන්ද කුමාර මහතා
4. ඩබ්. ඒ. විජයානන්ද මහතා
5. රෝහණ රත්නායක මහතා

# 2019

# විධායක නිලධාරී මණ්ඩලය

**සාමාන්‍යාධිකාරී**
ආර්. එම්. එන්. මොණරවිල මහතා

**මුදල් කළමනාකරු**
එන්. ඩී. ප්‍රියංකර කුමාර මහතා

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී**
එස්. ටී. කරුණාරත්න මහතා

**සැපයුම් කළමනාකරු**
ඊ. වී. කේ. කීර්තිරත්න මහතා

**කළමනාකරු (පරිපාලන හා මානව සම්පත් සංවර්ධන)(වැ.බ.)**
කේ. පී. ටී. එන්. දේවප්‍රිය මහතා

**අලෙවි කළමනාකරු**
එම්. ටී. ජේ. පෙරේරා මහතා

**නියෝජ්‍ය වැඩ කළමනාකරු**
ඩී. එම්. එම්. බී. දිසානායක මහතා

**නියෝජ්‍ය වැඩ කළමනාකරු**
ටී. එම්. ආර්. එන්. තෙන්නකෝන් මහතා

**නියෝජ්‍ය මුදල් කළමනාකරු**
කේ. එච්. තිලකරත්න මහතා

**කළමනාකරු (ලිපි ද්‍රව්‍ය කර්මාන්ත ශාලාව)**
එල්. ටී. ප්‍රේමසිරි මහතා

**ගණකාධිකාරී**
එම්. ආර්. පී. ජයවර්ධන මහතා

**ගණකාධිකාරී**
ඩබ්. එල්. දෙනියගේ මහතා

**අභ්‍යන්තර විගණක**
එම්. එස්. එස්. මොහොට්ටි මහතා

**සහකාර කළමනාකරු වැඩ (ඇස්තමේන්තු)**
කේ. ඩී. ටී. චන්ද්‍රසිරි මහතා

**සහකාර කළමනාකරු වැඩ (සුරක්ෂා)**
එම්. ඒ. කොතලාවල මහතා

**සහකාර කළමනාකරු වැඩ (ප්‍රොසෙස්)**
එස්. ඩී. කුමාරසිංහ මහතා

**සහකාර කළමනාකරු වැඩ (පොත් බැඳීම්)**
එම්. ඒ. ශාන්ත කුමාර මහතා

**සහකාර කළමනාකරු වැඩ (ලිතෝ)**
පී. කේ. තිලක් මහින්ද මහතා

**සහකාර කළමනාකරු (විකුණුම්)**
එච්. ආර්. ගුණසේකර මහතා

**සහකාර කළමනාකරු (ආරක්ෂක)**
ඩබ්. ඩබ්. එම්. ආරච්චිගේ මහතා

**සහකාර කළමනාකරු (පරිපාලන හා මානව සම්පත් සංවර්ධන)**
කේ. එච්. බී. සජීව මහතා

**සහකාර කළමනාකරු (නීති/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්)**
ඒ. එල්. ආර්. මධුකානි මහත්මිය

**සහකාර කළමනාකරු (ප්‍රකාශන)**
මධුරංග සී. නුවන්ප්‍රිය මහතා

**සහකාර කළමනාකරු (සැපයුම්)**
යූ. අනිල් ජයකාන්ත මහතා

**ගණකාධිකාරී**
ඩබ්. ඒ. ඒ. එස්. ජයසුන්දර මහතා

**සහකාර කළමනාකරු වැඩ (නඩත්තු)**
එන්. ජී. එල්. චන්දිමාල් මහතා

# 2019

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

1971 අංක 38 දරන මුදල් පනතේ 14 වන වගන්තියේ කොන්දේසි ප්‍රකාරව 2019 දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ ක්‍රියාත්මක වූ වැඩ පිළිවෙළ ඇතුළත් සිය 51 වෙනි වාර්තාව රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුටින් මෙසේ ඉදිරිපත් කරයි.


සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 ක් පවත්වන ලදී.

## 01. නිෂ්පාදනය

### 1.1 පාසල් පෙළ පොත්


### 1.1.1 පාසල් පෙළ පොත් මුද්‍රණය

පාසල් පෙළ පොත් මුද්‍රණය මූලික අරමුණ කර ගනිමින් පිහිටුවනු ලැබූ සංස්ථාව විවෘත ආර්ථිකය හඳුන්වා දීමත් සමගම වෙනත් නිෂ්පාදන අංශ කරා යොමුවී ඇත. ඒ සමගම පාසල් පොත් මුද්‍රණය ඍජුව සංස්ථාව වෙත පැවරීම වෙනුවට ටෙන්ඩර් මගින් තරගකාරීව අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ ඇණවුම් ලබා ගැනීමට සංස්ථාවට සිදුවිය. එහෙත් එම ක්‍රමය වෙනස් කරමින් 2019 වර්ෂයේදී ද ටෙන්ඩර් පටිපාටියෙන් පරිබාහිරව පෙළ පොත් මුද්‍රණය සංස්ථාවට පැවරීමට කැබිනට් අනුමැතිය ලැබිණි. ඒ අනුව 2019 වසරේ දී ද පාසල් පෙළ පොත් පිටපත් මිලියන 11.012ක් මුද්‍රණය කර දෙමින් සංස්ථාවට රු.මිලියන 1090.416 ක ආදායමක් ලැබුණි.




සමාලෝචිත වර්ෂයේ මුද්‍රණය කළ පාසල් පෙළ පොත් පිටපත් සංඛ්‍යාව හා ඉන් ලද ආදායම 2017 හා 2018 ට සාපේක්ෂව පහත දැක්වේ.

| පාසල් මුද්‍රණ වැඩ | 2017 ('000) | 2018 ('000) | 2019 ('000) |
|---|---|---|---|
| පිටපත් සංඛ්‍යාව | 7,981 | 4,485 | 11,012 |
| ආදායම - රු. | 676,391 | 428,627 | 1090,416 |





### 1.2 වෙනත් මුද්‍රණ සේවා


සමාලෝචිත වර්ෂය තුළදී දහම් පාසල් පොත් මුද්‍රණය, ආරක්ෂිත මුද්‍රණ සේවා (ලොතරැයිපත්, රිදී රේඛා, බැංකු තැන්පත් සහතික පත්, තැපැල් පාස්පොත්, ලේබල්, එයාපෝර්ට් සුපර් ඩ්‍රෝ යනාදිය) සහ රාජ්‍ය ආයතන සඳහා මුද්‍රණ සේවා සපයන ලදී. එමෙන්ම විවිධ ආයතන සඳහා දිනපොත්, කැලැන්ඩර් යනාදිය මුද්‍රණය කරන ලදී. මීට අමතරව විවිධ ආයතනවල මුද්‍රණ කාර්යයන් ද ඉටු කරන ලදී. විශේෂ මුද්‍රණ සේවා කිහිපයක් පහත පරිදි වේ.

### 1.2.1 සුරක්ෂා මුද්‍රණ සේවා

ජාතික ලොතරැයි මණ්ඩලය සඳහා මහජන සම්පත ලොතරැයිය දැනට වසර 45 ක පමණ කාලයක් මුද්‍රණය කරන ලදී. මීට අමතරව මෙගා පවර්, නීරෝගා, දරු දිරි සම්පත ලොතරැයිය ද මුද්‍රණය කරනු ලැබේ. ලොතරැයි මණ්ඩලයෙන් ලද සියලුම ඇණවුම් මුද්‍රණය කර දුන් අතර, 2019 වසරේ දී මුද්‍රණය වූ ලොතරැයි ප්‍රමාණය මිලියන 524.05 කි. ඒ අනුව ආදායම රු. මිලියන 293.720 ක් වී ඇත. ලොතරැයි මුද්‍රණයේ ආදායම හා පිටපත් සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.




| ලොතරැයි මුද්‍රණ වැඩ | 2017 ('000) | 2018 ('000) | 2019 ('000) |
|---|---|---|---|
| පිටපත් සංඛ්‍යාව | 399,739 | 427,415 | 524,474 |
| ආදායම - රු. | 233,947 | 248,011 | 293,440 |




### 1.2.2 වෙනත් මුද්‍රණ සේවා

රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සඳහා මෙන්ම පෞද්ගලික අංශයේ ඇණවුම් ලබා ගැනීම කෙරෙහි විශේෂ උනන්දුවකින් ක්‍රියා කරන ලදි. ඉටු කරන ලද විශේෂ මුද්‍රණ සේවා අතර පහත සඳහන් සේවා ප්‍රධාන තැනක් ගන්නා ලදි.


01. විවිධ ආයතනයන් සඳහා වූ වාර්ෂික වාර්තා
02. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සඳහා වූ විවිධ මුද්‍රණ වැඩ
03. විශ්වවිද්‍යාල සහතික පත්
04. ජාතික සත්වෝද්‍යානයට අයත් ප්‍රවේශ පත්‍ර හා අනෙකුත් විස්තර පත්‍රිකා
05. සිනමාශාලා ටිකට්පත්
06. සේවක අර්ථසාධක අරමුදලේ විවිධ මුද්‍රණ වැඩ
07. ජාතික ඉතිරි කිරීමේ බැංකුවට අයත් මුද්‍රණ කටයුතු
08. විභාග දෙපාර්තමේන්තුව සඳහා මුද්‍රණය කරන ලද උත්තර ලියන කඩදාසි පොත්
09. දහම් පාසල් පොත් මුද්‍රණය

සමාලෝචිත වර්ෂයේදී විවිධ මුද්‍රණ වැඩ ඉටු කරමින් සංස්ථාව ලත් ආදායම රු. මිලියන 183 කි.

## 1.3 අභ්‍යාස පොත් සහ අනෙකුත් පොත් නිෂ්පාදනය


2019 වසරේ දී නිෂ්පාදනය පහත පරිදි වේ.

| විස්තරය | නිෂ්පාදන ප්‍රමාණය | වටිනාකම (රුපියල්) |
|---|---|---|
| අභ්‍යාස පොත් (පිටු 80 පොත් වලින්) | මිලියන 5.267 | මිලියන 150,720 |
| සී. ආර්. පොත් (පිටු 80 සී.ආර්. පොත් වලින්) | මිලියන 0.371 | මිලියන 22,992 |
| වෙනත් ලිපිද්‍රව්‍ය නිෂ්පාදන (ඒකක වලින්) | මිලියන 0.128 | මිලියන 13,313 |
| එකතුව | මිලියන 5.766 | මිලියන 187,035 |




සමාලෝචිත වර්ෂයේදී ලිපිද්‍රව්‍ය අංශයේ නිෂ්පාදනය 2017 හා 2018 වසරවලට සාපේක්ෂව පහත පරිදි වේ.

| අභ්‍යාස පොත් හා අනෙකුත් පොත් | 2017 ('000) | 2018 ('000) | 2019 ('000) |
|---|---|---|---|
| පොත් පිටපත් සංඛ්‍යාව | 10,785 | 7,220 | 5,766 |
| ආදායම - රු. | 279,680 | 238,333 | 187,035 |





8/7/2019 සිට 19/7/2020 දක්වා (දින 11) සහ 16/9/2020 සිට 13/11/2020 දක්වා (දින 58) කාල පරාසය තුළ ලියන කඩදාසි තොග නොලැබීම නිසා 2019 වර්ෂයේ අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමට නොහැකි විය.

2019 වසරේ නිෂ්පාදන ඉලක්කය : මිලියන 12,12

(වටිනාකම රු.මිලියන 327)

## 02. අලෙවි හා විකුණුම්

| වර්ෂය | 2017 රු. | 2018 රු. | 2019 රු. |
|---|---|---|---|
| සමස්ත ආදායම (බදු ඇතුළත්) | 286,849,475.00 | 282,021,852.00 | 153,082,388.79 |




2019 වර්ෂයේදි සමස්ත අලෙවි ආදායම විශාල වශයෙන් අඩු වීමක් සිදු වී ඇත.

2017 වසරට සාපේක්ෂව 2018 වර්ෂයේ අභ්‍යාස පොත් ආදායම අඩුවීමේ ප්‍රතිශතය වූ 1.89% ප්‍රමාණය 2019 වර්ෂයේ දී 45.71% දක්වා පහත වැටී ඇත. ආදායම් අඩුවීමට ප්‍රධාන හේතුව ලෙස 2019 වර්ෂයේ අභ්‍යාස පොත් නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීමේ හිඟය නිසා නිෂ්පාදනය පෙර වර්ෂවලට සාපේක්ෂව විශාල ලෙස පහත වැටිණි.

මීට අතිරේකව බාහිර ආයතන මගින් මිලට ගෙන නැවත අලෙවි කිරීමට යොදාගන්නා ලිපිද්‍රව්‍ය අයිතමයන් 2019 වර්ෂය තුළ අපේක්ෂිත පරිදි සපයා ගැනීමට නොහැකි වීම අපේක්ෂිත ආදායම් අඩුවීමට හේතු වී ඇත.

සංස්ථා නිෂ්පාදනයෙන් සහ බාහිර ලිපිද්‍රව්‍ය අයිතමයන් අපේක්ෂා කළ පරිදි නිෂ්පාදනය හා සපයා ගැනීමේ හැකියාව පැවතියේ නම් එම වර්ෂය තුළ ආදායම තවදුරටත් 15% අතර ප්‍රමාණයකින් ඉහළ නංවා ගැනීමේ හැකියාව පැවතිණි.

#### ප්‍රකාශන සේවා

2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේ දී ප්‍රකාශන ආදායමේ අඩු වීමක් පෙන්නුම් කරයි. පෙර වර්ෂයේ දී වෙනත් ප්‍රකාශකයන්ගේ ප්‍රකාශන අලෙවි කිරීමට ප්‍රමුඛතාව ලබා දී තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දී එහි පසුබෑමක් පෙන්නුම් කරයි. මෙම වර්ෂය තුළ කිසිදු සංස්ථා ප්‍රකාශනයක් පළකර නොමැත.

| | |
|---|---|
| 2019 ප්‍රකාශිත නව කෘති ගණන | 00 |
| 2017 ලද ප්‍රකාශන ආදායම | මිලියන 3.2 |
| 2018 ලද ප්‍රකාශන ආදායම | මිලියන 5.2 |
| 2019 ලද ප්‍රකාශන ආදායම | මිලියන 2.3 |

## 03. ස්ථාවර වත්කම්

2019 වර්ෂය අවසානයේ දී සංස්ථාව සතු ස්ථාවර වත්කම්වල මුළු පිරිවැය රු. 1,168,709,786/- විය. එහි ශුද්ධ වටිනාකම රු. 991,125,221/- කි. මෙම තත්ත්වය මීට පෙර එනම් 2018 වසර හා සැසඳීමේ දී පිළිවෙළින් රු. 1,148,392,769 ක් හා රු. 1,039,094,309/- ක් වශයෙන් විය.

| ස්ථාවර වත්කම් | 2017 රු.('000) | 2018 රු.('000) | 2019 රු.('000) |
|---|---|---|---|
| ආරම්භක වටිනාකම (පිරිවැයට) | 872,653 | 1,148,393 | 1,168,709 |
| වර්ෂ අවසාන ශුද්ධ වටිනාකම | 1,093,382 | 1,039,094 | 991,125 |

## 04. බදු බැඳියාව


සංස්ථාව තක්සේරු වර්ෂ 2019/2020 සඳහා ආදායම් බදු හා ලාභාංශ බදු ලෙස කිසියම් හෝ මුදලක් සංස්ථාවේ 2019 වසරේ අවසාන ගිණුම් අනුව ප්‍රතිපාදනය කොට නොමැත. (සංස්ථාව ශුද්ධ අලාභ තත්වයක පැවතීම නිසා)

| බදු බැඳියාව | 2017 රු. ('000) | 2018 රු. ('000) | 2019 රු. ('000) |
|---|---|---|---|
| ආදායම් බදු | - | - | - |
| ලාභාංශ බදු | - | - | - |
| එකතුව | - | - | - |

## 05. ලාභය

2019 වසර තුළ දී සංස්ථාව රු. 169,428,397/-ක බදු පූර්ව අලාභයක් උපයා ඇති අතර, 2018 වසරේ දී රු. 406,986,259/- ක අලාභයක් විය.


| ලාභදායිතාව | 2017 රු. ('000) | 2018 රු. ('000) | 2019 රු. ('000) |
|---|---|---|---|
| බදු පූර්ව ලාභය | (243,094) | (406,985) | (169,428) |
| බදු ප්‍රතිපාදනයෙන් පසු | (243,094) | (406,985) | (169,428) |



## 06. ප්‍රසාද දීමනා

2018 වසරේ දී සංස්ථාව රුපියල් මිලියන 409 ක විශාල අලාභයක් ලැබූ බැවින් සුපුරුදු ලෙස මාස දෙකක වැටුපට සමානව ප්‍රසාද දීමනා ගෙවීම් නොකළ අතර ඒ අනුව කිසිදු ප්‍රසාද දීමනාවක් සංස්ථා සේවකයින්ට ගෙවීමට නොහැකි විය. එහෙත් 2019 වර්ෂයේ දී 2018 වර්ෂයට සාපේක්ෂව ආදායම් තත්ත්වයේ ශීඝ්‍ර වර්ධනයක් ලබා ගනිමින් අලාභදායි තත්ත්වය රු. මිලියන 409 සිට රු. මිලියන 169 දක්වා අඩුකර ගැනීමට හැකි වූ බැවින් සේවක අභිප්‍රේරණය පිණිස සේවකයෙකුගේ එක් වැටුපට සමාන මුදලක් එනම් රු. මිලියන 22 ක මුදලක් ප්‍රසාද දීමනා ලෙස ගෙවීම් කර ඇත.

| ප්‍රසාද දීමනා | 2017 රු. ('000) | 2018 රු. ('000) | 2019 රු. ('000) |
|---|---|---|---|
| | 50,191 | 1,408 | 22,097 |




## 07. සුභ සාධනය

පහත සඳහන් සුභ සාධන සේවා හා පහසුකම් පසුගිය වර්ෂයේ පදනම යටතේ මෙම වසර තුළදී ද පවත්වා ගෙන යන ලදී. මේ වෙනුවෙන් සංස්ථාව වැය කළ මුළු මුදල රු. මිලියන 98 ක් විය.

| | සුභ සාධනය | 2017 රු.('000) | 2018 රු.('000) | 2019 රු.('000) |
|---|---|---|---|---|
| 01. | සේවක ප්‍රවාහන පහසුකම් | 11,012 | 10,879 | 8,503 |
| 02. | සේවක දිරි දීමනා ගෙවීම් | 6,020 | 5,263 | 4,784 |
| 03. | වෛද්‍යාධාර ප්‍රතිලාභ ගෙවීම | 10,612 | 10,046 | 9,431 |
| 04. | සේවක විවිධ සුභ සාධනය | 24,924 | 24,204 | 21,171 |
| 05. | කම්කරු වන්දි ආරක්ෂණය | - | - | - |
| 06. | සියලුම සේවකයින් සඳහා ලිපිද්‍රව්‍ය තෑගි වවුචරයක් ප්‍රදානය කිරීම | 1,685 | 1,703 | 1,378 |
| 07. | සේවක ප්‍රසාද දීමනා | 50,191 | 1,408 | 22,097 |
| 08. | සේවක නිවාස ණය ප්‍රතිපූරණය | 3,114 | 2,573 | 2,087 |
| 09. | සේවක ඉතිරි නිවාඩු සඳහා ගෙවීම | 15,607 | 13,615 | 13,210 |
| 10. | විශේෂ දිරි දීමනා | 7,490 | - | 15,675 |
| | **එකතුව** | **130,657** | **69,748** | **98,336** |

# 08. සේවක මණ්ඩලය

2019. 12. 31 දිනට සංස්ථාවේ සේවක සංඛ්‍යාව 599 කි.

| සේවක සංඛ්‍යාව | 2019 |
|---|---|
| කාර්යාලය | 139 |
| ප්‍රධාන මුද්‍රණාලය | 314 |
| ලිපිද්‍රව්‍ය කම්හල | 60 |
| ආරක්ෂක අංශය | 42 |
| අලෙවිසැල් | 44 |
| **මුළු සේවක සංඛ්‍යාව** | **599** |

### 2019 වර්ෂය තුළ දී සේවයට බඳවාගෙන ඇති නිලධාරීන්

2019 වර්ෂය තුළදී සංස්ථාවට නිලධාරී මට්ටමේ සේවක මහත්ම මහත්මීන් කිසිවකු බඳවාගෙන නොමැත.

### 2019 වර්ෂය තුළ දී සේවයෙන් ඉවත් වූ නිලධාරීන්

| | නම/තනතුර | දිනය |
|---|---|---|
| 1. | ආර්. එම්. එන්. මොනරවිල මහතා<br>- සාමාන්‍යාධිකාරී | 2019. 08. 22 |
| 02. | ඩබ්. එල්. දෙනියගේ මහතා<br>- ගණකාධිකාරී | 2019. 10. 09 |
| 03. | එන්. ඩී. ප්‍රියංකර කුමාර මහතා<br>- මුදල් කළමනාකරු | 2019. 10. 10 |

## සමාප්තිය

සංස්ථාවේ වැඩ කටයුතු ඉතා සාර්ථක ලෙස කර ගෙන යාම සඳහා ඉතා ලැදිව සහයෝගය දුන් සංස්ථාවේ සියලු සේවකයන්ට සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තුතිය පිරිනැමේ. සාර්ථක වැඩ පිළිවෙළක් සඳහා සෑම විටම මග පෙන්වීම කරමින් සහාය ලබාදුන් ගරු අධ්‍යාපන අමාත්‍යතුමාටත්, එම වැඩ පිළිවෙළට නිරතුරුව සහයෝගය ලබාදුන් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තුතිය පිරිනැමේ.

ඉදිරි වර්ෂය තුළදී ද එවැනිම සහයෝගයක් හා ප්‍රතිචාරයක් සංස්ථාවේ සියලු සේවකයින්ගෙන් පාලනාධිකාරිය බලාපොරොත්තු වන්නේය.

**ජනක රත්නකුමාර**
සභාපති

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්
## 2019 දෙසැම්බර් 31 වැනිදා වන විට

## 1. සංස්ථාව පිළිබඳ තොරතුරු

### 1.1 වාර්තාකරණ ආයතනය

1968 අංක 24 දරන පාර්ලිමේන්තු පනතට අනුව රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව 1968 වසරේදී ස්ථාපනය කෙරිණි. ආයතනික අධ්‍යක්ෂ මණ්ඩලය එහි කළමනාකාරීත්වය භාරව ක්‍රියා කරයි.
පාදුක්ක, පානළුව ප්‍රදේශයේ මෙය පිහිටා තිබේ.

### 1.2 ප්‍රධාන කාර්යයන් හා මෙහෙයුම්වල ස්වභාවය

සංස්ථාවේ ප්‍රධාන කාර්යයන් වන්නේ පාසල් පෙළ පොත් මුද්‍රණය, අභ්‍යාස පොත් නිෂ්පාදනය හා වෙනත් මුද්‍රණ කාර්යයන් සිදු කිරීමයි.

## 2. ගිණුම් ප්‍රමිතීන් හා පිළියෙල කිරීමේ පදනම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, ආදායම් පිළිබඳ පුළුල් ප්‍රකාශනය, අරමුදල් හා මුදල් ගලා ඒමේ වෙනස්කම් සහ ප්‍රතිපත්ති මෙන්ම සටහන් සකසා ඇත්තේ LKAS සහ SLFRS යන ගිණුම්කරණ ප්‍රමිතීන් හා 1971 අංක 38 දරන මූල්‍ය පනතට අනුවය.

### 2.1 අනුකූලතා ප්‍රකාශය

උපචිත පදනම හා ඓතිහාසික පිරිවැය පදනම් කර ගනිමින් මූල්‍ය ප්‍රකාශනය සකසා තිබේ. ශ්‍රී ලංකා රුපියල්වලින් එය ඉදිරිපත් කර ඇත.

### 2.2 ඇගයුම් පදනම

පහත සඳහන් කරුණු හැර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබෙන්නේ ඓතිහාසික පිරිවැය පදනම් කර ගෙනය.

* විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සඳහන් පොලී ආදායම
* ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම්

### 2.3 අඛණ්ඩ පැවැත්ම

සංස්ථාව පවත්වා ගෙන යාමට ඇති හැකියාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය තක්සේරුවක් සිදු කොට අවධානය යොමු කර ඇත. කෙසේ වෙතත් එය ඇවර කිරීමට හෝ මෙහෙයුම් නතර කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අපේක්ෂා නොකරයි.

### 2.4 භාවිතාවන ව්‍යවහාර මුදල්

අවසාන ගිණුම් ඉදිරිපත් කර ඇත්තේ සංස්ථාවේ ව්‍යවහාර මුදල් වූ ශ්‍රී ලංකා රුපියල්වලිනි.

සියලුම මූල්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇත්තේ රුපියල්වලින් වන අතර ආසන්න රුපියලේ අගයට වටිනාකම් දක්වා ඇත.

### 2.5 සංසන්දනාත්මක තොරතුරු

සංස්ථාව විසින් කලින් අවුරුදුවල අනුගමනය කළ ගිණුම් ප්‍රතිපත්තීන් නොවෙනස්ව ඒ ආකාරයෙන් අනුගමනය කර ඇත. අවශ්‍ය අවස්ථාවල කලින් අවුරුදුවල වටිනාකම් හා සඳහන් කිරීම් නැවත සකසා ඉදිරිපත් කිරීම් කර ඇත. සංස්ථාව විසින් ඉකුත් වර්ෂවලට අදාළ වැරදි නිවැරදි කිරීම් අතීතානුයෝගීව ගළපා ඉකුත් වර්ෂයේ මූල්‍ය තත්වය නැවත ප්‍රකාශ කර ඇත.

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

පහත සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සියලුම කාලපරිච්ඡේදයන් සඳහා ඒකාකාරී ලෙස නොකඩවා සංස්ථාව විසින් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇත.

### 3.1 දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ සඳහන් කර ඇත්තේ එකතු ක්ෂයවීම් අඩු කරන ලද ශුද්ධ පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකම වේ.

පහත සඳහන් දිනවල තක්සේරු දෙපාර්තමේන්තුව විසින් වත්කම් තක්සේරු කරන ලදී.

| | |
|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | - 02. 01. 2017 සිට 06. 01. 2017 දක්වා |
| කාර්යාලයීය උපකරණ<br>ලී බඩු හා සවිකිරීම්<br>පරිගණක උපාංග | - 02. 01. 2017 සිට 30. 01. 2017 දක්වා |
| යන්ත්‍ර හා පිරියත | - 16. 01. 2017 සිට 30. 01. 2017 දක්වා |
| මෝටර් රථවාහන | - 13. 01. 2016 සිට 14. 01. 2016 දක්වා |

වත්කම් ප්‍රත්‍යාගණනයේ වෙනස හෝ ලාභය විස්තීරණ ආදායම තුළ දක්වා ඇති අතර හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය තුළ ප්‍රත්‍යාගණන සංචිතය නමින් ප්‍රත්‍යාගණන ලාභය දක්වා ඇත.
වත්කම් ප්‍රත්‍යාගණනයෙන් පසු කාර්යාලීය උපකරණ සහ ලී බඩු හා සවිකිරීම් එකම පංතියක් ලෙසත් උපකරණ මෙවලම් සහ අත් කරත්ත තවත් පංතියක් ලෙසත් වර්ගීකරණය කර ඉදිරිපත් කර ඇත.

#### 3.1.1 ක්‍ෂයවීම්

දේපළ, පිරියත සහ උපකරණවල ඵලදායී ජීවකාලය පිළිබඳ තක්සේරුවකින් පසු සරල මාර්ග ක්‍රමයට ක්‍ෂය වීම් ගණනය කරනු ලැබේ.

**තක්සේරු කරන ලද වත්මන් හා සංසන්දනාත්මක ඵලදායී ජීවකාලය පහත පරිදි වේ.**

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 40 යි |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | වසර 13.33 යි |
| මෝටර් හා වෙනත් වාහන | වසර 04 යි |
| කාර්යාලයීය උපකරණ හා ලී බඩු | වසර 10 යි |
| පරිගණක හා උපාංග | වසර 03 යි |

### 3.2 තොගය

තොගය පිරිවැය හා ශුද්ධ උපලබ්ධිත අගය යන අගයන්ගෙන් අවම අගයට ගණනය කර ඇත.

### 3.3 බදුකරණය

#### 3.3.1 ආදායම් බදු

අදාළ වර්ෂයේ සහ පෙර වර්ෂවලට අදාළ ආදායම් බදු බැරකම් හෝ වත්කම් දේශීය ආදායම් කොමසාරිස් වෙත ගෙවීමට හෝ අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

ආදායම් බදු ගණනය කිරීමේදී මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර ඇති දිනට වලංගු බදු ප්‍රතිශතයන් සහ එදිනට නීතිරීති වලට අනුව කටයුතු කරනු ලැබේ. ආදායම් බදු සඳහා වෙන් කිරීමේදී මූල්‍ය ප්‍රකාශනවල සඳහන්ව ඇති ආදායම් සහ වැය ප්‍රභවයන්ට අනුව 2006 වර්ෂයේ දේශීය ආදායම් පනතේ 10 වන ඡේදයට අනුව සහ ඉන් පසුව සිදුකරන ලද සංශෝධනවලට යටත්ව කටයුතු කරනු ඇත.

### 3.4 මුදල් හා මුදල්වලට සමාන දෑ

අත ඇති මුදල්, මාර්ගස්ථ මුදල් සහ බැංකුවේ ඇති මුදල්, මුදල් හා මුදල්වලට සමාන දෑ ලෙස සලකනු ලැබේ.
අරමුදල් ප්‍රධාන ප්‍රකාශනයේදී බැංකු අයිරාව සහ බැංකු ශේෂයට වැඩියෙන් ලබාගත් මුදල් ද මුදල් හා මුදල් වලට සමාන දෑ ලෙස සලකනු ලැබේ.

මුදල් හා මුදල්වලට සමාන දෑ කෙටි කාලීන මුදල් අවශ්‍යතා සහ අනෙකුත් ගනුදෙනු සඳහා අධික ද්‍රවශීලතාවයක් ඇති ලෙස සැලකේ.

## 4. මූල්‍ය උපාංග - මූලික හඳුනාගැනීම් හා ඉදිරි පියවර

### 4.1 මූල්‍ය වත්කම්

#### 4.1.1 වෙළඳ ණය ගැතියෝ

වෙළඳ ණය ගැතියන් සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම්කර ඇත.

### 4.2 මූල්‍ය බැඳුම්කර

#### 4.2.1 දේපළ උකස් කිරීම

සංස්ථාවේ සියළු බැංකු පහසුකම් එනම් බැංකු අයිරාව, කෙටිකාලීන ණය, දිගුකාලීන ණය, ණයවර ලිපි හා කාර්ය සාධන බැංකු ඇපකර ලබාගැනීම සඳහා මහජන බැංකුව වෙත අංක MB 979/3063/3243/1147/422/5789 මගින් සංස්ථාවේ දේපල පිරියත හා උපකරණ උකස් කර ඇත.

මීට අමතරව රාජ්‍ය භාණ්ඩාගාර ඇපකරයක් මගින් 2018/09/07 දින අංක TO/REV/TG/522 යටතේ ද පහත ව්‍යාපෘති සඳහන් කරමින් මහජන බැංකු ණය පහසුකම් ලබාගෙන ඇත.

| ව්‍යාපෘතියේ නම | සුරක්ෂිත මුදල (රු.) | කල් ඉකුත්වන දිනය |
|---|---|---|
| බැංකු අයිරා, ණයවර ලිපි හා බැඳුම්කර පහසුකම් සඳහා | මිලියන 1,165 | 2021. 09. 05 |
| අළුත්වැඩියා සහ ක්‍රියාකාරකම් වර්ධනයට මූල්‍ය වෙන්කිරීම සඳහා | මිලියන 185 | 2023. 09. 15 |

#### 4.2.2 අසම්භාව්‍ය බැරකම් හා ප්‍රාග්ධන බැඳීම්

(අ) සියළු ප්‍රමාණාත්මක ප්‍රාග්ධන බැඳීම් හා අසම්භාව්‍ය බැරකම් සලකා බලා ඇති අතර මෙම මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපුම් හා අනාවරණයක් සිදු කර ඇත.

(ආ) ලිපිගොනු අංක FR248/1 යටතේ සංස්ථාවේ හිටපු අලෙවි කළමනාකරු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කළ මූලික අයිතිවාසිකම් නඩුවක් විභාග වෙමින් පවතී.

සංස්ථාව විසින් මුද්‍රණය කරනු ලබන පාසැල් පෙළ පොත්, දහම් පාසල් පොත් හා ලොතරැයි මුද්‍රණය හා බෙදා හැරීම සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව සහ ජාතික ලොතරැයි මණ්ඩලය වෙත කාර්යය සාධන බැංකු ඇපකර හා අත්තිකාරම් ගෙවීම් බැඳුම්කර ඉදිරිපත් කර ඇත.

අසම්භාව්‍ය වගකීම් වල මුලු මුදල රු. 130,695,700 ක් වන අතර 2019. 12. 31 දිනට විවෘත කර ඇති ආනයන ණයවර ලිපි වටිනාකම රු. 67,889,175 ක් වේ.

#### 4.3.1 සංචිත

සංස්ථාවේ ආරම්භක ප්‍රාග්ධනය සඳහා පහත පඳහන් පරිදි ප්‍රාග්ධන සංචිතය, පොදු සංචිතය හා සංවර්ධන සංචිතය ඇතුලත් වන පරිදි රජයේ ඒකාබද්ධ අරමුදලින් දායකත්වය ලබා දී තිබේ.

| | | |
|---|---|---|
| ප්‍රාග්ධන සංචිත | Rs. | 102,490.50 |
| සංවර්ධන සංචිත | Rs. | 13,901,142.23 |
| පොදු සංචිත | Rs. | 1,000,000.00 |
| | **Rs.** | **15,003,632.73** |

සංස්ථාවේ මුල් ගිණුම් කට්ටලයේ සිට මේ දක්වා මෙම සංචිත මූල්‍ය ප්‍රකාශනවල දිගටම පැවතුන අතර මෙම සංචිත පවත්වාගෙන යාමේ අරමුණ පැහැදිලි නැත.

#### 4.3.2 ප්‍රත්‍යාගණන සංචිතය

මෙම සංචිතයට 2016 වසරේදී මෝටර් රථවාහන නැවත තක්සේරු කිරීමෙන් උපදවන ලද ලාභය හා පහත දක්වෙන පරිදි දේපළ උපකරණ හා පිරියත වල නැවත ප්‍රත්‍යාගණනය කිරීමෙන් ජනිත වූ ලාභය ද ඇතුලත් වේ.

| | 2016 (Rs.) | 2017/18 ( Rs.) |
|---|---|---|
| මෝටර් හා වෙනත් වාහන | 36,015,363 | |
| දේපළ | | 377,290,608 |
| ගොඩනැගිලි | | 158,049,568 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | | 246,979,194 |
| කාර්යාලයීය උපකරණ සහ ලීබඩු | | (8,785,874) |
| පරිගණක හා උපාංග | | (1,537,152) |
| | **36,015,363** | **771,996,344** |

## 5. විශ්‍රාම පාරිතෝෂිත වගකීම්

### 5.1 විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක 12 පාරිතෝෂික දීමනා පනතට අනුව පාරිතෝෂික දීමනාව ගෙවීමට සංස්ථාව බැඳී සිටින අතර මෙතෙක් නියමිත දිනවලට එම දීමනාව ගෙවා ඇති අතර 2019. 12. 31 දිනට පාරිතෝෂික වෙන්කිරීමට අදාළ අරමුදලක් සංස්ථාව විසින් පවත්වාගෙන යනු නොලැබේ.

### 5.2 සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදලේ හා සේවක භාරකාර අරමුදලේ නීතිරීතිවලට අනුව සංස්ථාව (සේවායෝජක) විසින් සේවාදායකයා වෙත අදාළ අරමුදල් සඳහා බැර කිරීමට බැඳී සිටී. සංස්ථාව විසින් 12% ක් සහ 3%ක් සේවාදායකයාගේ දළ වැටුපට අනුව සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා භාරකාර අරමුදලට පිළිවෙළින් දායකත්වයක් ලබාදෙනු ලැබේ.

## 6. ආදායම් හා වියදම්

### 6.1 ආදායම් හඳුනාගැනීම

උපචිත පදනම මත සියලු ආදායම් හඳුනා ගැනේ.

**පොලී ආදායම**

සංස්ථා සේවකයන්ට ලබා දෙන ණය සඳහා 10% ක පොලියක් අය කරනු ලැබේ.

### 6.2 වියදම් හඳුනාගැනීම

**අයභාර වියදම්**

සංස්ථාවේ පැවැත්මට හා දේපළ හා උපකරණ කාර්යක්ෂමව නඩත්තු කිරීමට දරන ලද සියළු වියදම් වර්ෂය තුළ ආදායමින් අයකර ඇත.

**ප්‍රාග්ධන වියදම්**

සංස්ථාවේ දේපළ හා උපකරණ වල ඉපයීමේ ධාරිතාව වර්ධනය කරගැනීම හා ඉදිරියට ගෙනයාම සඳහා, දේපළ අත්පත් කරගැනීම සඳහා දිගු කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරන ලද සියළු වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

### 6.3 ණයට ගැනුම් පිරිවැය

ණයට ගැනුම් පිරිවැය ඒවා සිදුවූ කාලය තුළ වියදම් ලෙස හඳුනාගැනෙන අතර යන්ත්‍ර හා පිරියත ඒවා ක්‍රියාකාරීත්වයට පත්වන තෙක් දරණ ලද ඊට අදාළ පොලී වියදම ප්‍රාග්ධනගත කර ඇත.

## 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශන

| | සටහන | 2019 | 2018 |
|---|---|---|---|
| **වත්කම්** | | රු. | රු. |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 15 | 991,125,221 | 1,039,094,309 |
| විලම්බිත බදු වගකීම් | 16 | 17,105,398 | 11,566,933 |
| | | **1,008,230,619** | **1,050,661,242** |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | 17 | 275,133,678 | 438,499,410 |
| වෙළඳ ලැබීම් | 18 | 393,268,112 | 299,687,983 |
| වෙනත් ලැබීම් | 19 | 28,942,689 | 46,143,558 |
| පූර්ව ගෙවීම් | | 386,775 | 235,476 |
| මුදල් හා මුදල්වලට සමාන දෑ | 20 | 31,459,352 | 34,940,656 |
| මුළු ජංගම වත්කම් | | **729,190,607** | **819,507,084** |
| **මුළු වත්කම්** | | **1,737,421,226** | **1,870,168,326** |
| **ස්කන්ධය හා බැරකම්** | | | |
| ප්‍රාග්ධන නිකුතුව | | 15,000,000 | 15,000,000 |
| සංචිත | | 15,003,633 | 15,003,633 |
| රඳවා ගත් ඉපයීම් | | (648,559,112) | (446,833,123) |
| එකතු කළා: ප්‍රත්‍යාගණන ලාභ | | 808,011,707 | 808,011,707 |
| **මුළු ස්කන්ධය** | | **189,456,229** | **391,182,216** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| බැංකු ණය - දිගු කාලීන | 21 | 136,642,139 | 174,000,236 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් | | 191,707,011 | 215,155,555 |
| එකතුව - ජංගම නොවන බැරකම් | | **328,349,150** | **389,155,791** |
| **ජංගම බැරකම්** | | | |
| වෙළඳ ගෙවීම් | 22 | 240,546,047 | 174,435,807 |
| වෙනත් ගෙවීම් | 23 | 71,885,027 | 46,319,872 |
| කෙටි කාලීන ණය - (ණය පොළී සහිත) | 24 | 840,717,598 | 770,860,679 |
| ගෙවිය යුතු ණය ශේෂය (පොළී රහිතව මිලදී ගැනීම්) | | 46,765,102 | 46,765,102 |
| බැංකු අයිරා | | 19,702,073 | 51,448,858 |
| මුළු ජංගම බැරකම් | | **1,219,615,847** | **1,089,830,319** |
| **මුළු ස්කන්ධය හා බැරකම්** | | **1,737,421,226** | **1,870,168,327** |

සංස්ථාවේ මෙම මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මූල්‍ය පනතේ අවශ්‍යතාවන්ට අනුකූල බව සහතික කරමු.

..........................................
**එම්. ආර්. පී. ජයවර්ධන**
ගණකාධිකාරි

මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම් දරයි. ඒවා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇති අතර ඔවුන් වෙනුවෙන් අත්සන් තබා තිබේ. පිටු අංක 15, 16 සහ 17 හි ඇතුළත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 19, 20 මෙන්ම 24 සිට 26 දක්වා ඇතුළත් අදාළ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල වැදගත්ම අංග වේ.

..........................................
**පී. පී. එච්. ජේ. ඒ. රත්නකුමාර**
සභාපති/අධ්‍යක්ෂ

..........................................
**ජී. වී. නන්දකුමාර්**
අධ්‍යක්ෂ

# 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වයට අදාළ සටහන්

| | 2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|
| **16. විලම්බිත බදු බැරකම්** | | |
| වර්ෂය ආරම්භක දිනට | 11,566,933 | 11,268,578 |
| වර්ෂය තුළදී ගැළපීම්/වෙනස් වීම් | 5,538,465 | 298,355 |
| වර්ෂය අවසාන දිනට | **17,105,398** | **11,566,933** |
| **17. තොගය** | | |
| අමුද්‍රව්‍ය | 95,086,893 | 203,092,192 |
| පාරිභෝගික භාණ්ඩ | 9,408,053 | 10,278,420 |
| අමතර කොටස් | 36,733,611 | 37,367,250 |
| ලෝහ භාණ්ඩ / ගොඩනැගිලි ද්‍රව්‍ය | 946,267 | 1,202,906 |
| නිමි තොගය | 72,762,017 | 107,217,687 |
| නොනිමි තොගය | 56,729,063 | 79,340,955 |
| මාර්ගස්ථ තොග (අමතර කොටස්) | 3,467,774 | |
| | **275,133,678** | **438,499,410** |
| **18. වෙළඳ ලැබීම්** | | |
| වෙළඳ ණයගැතියෝ | 434,984,532 | 326,778,134 |
| බොල් ණය සඳහා වෙන් කිරීම් | (33,049,263) | (27,451,460) |
| අ.ප්‍ර.දෙ. තත්ත්ව හානි/දඩ වෙන්කිරීම් | (9,028,466) | - |
| වෙනත් ණයගැතියෝ | 361,309 | 361,309 |
| | **393,268,112** | **299,687,983** |
| **19. වෙනත් ලැබීම්** | | |
| සේවක ණය හා අත්තිකාරම් (සටහන 19.1) | 8,817,032 | 12,969,692 |
| තැන්පතු හා ලැබීම් (සටහන 19.2) | 10,266,188 | 14,613,129 |
| විකුණුම් පාලන ගිණුම (සටහන 19.3) | (4,673,971.09) | (2,157,001.08) |
| බැංකු ණය - Margin A/C -PB International | 14,533,440 | 12,377,566 |
| අයකරවා ගතහැකි බදු (ඉ/ගෙ. යෙදවුම් වැට් බදු) | - | 8,340,172 |
| | **28,942,689** | **46,143,558** |
| **19.1 ණය හා අත්තිකාරම්** | | |
| ආපදා ණය | 5,332,274 | 9,788,758 |
| උත්සව අත්තිකාරම් | 2,204,000 | 2,378,000 |
| සේවක වැටුප් අත්තිකාරම් | - | 6,000 |
| ණය හිමි අත්තිකාරම් ගිණුම | 1,280,758 | 796,934 |
| | **8,817,032** | **12,969,692** |
| **19.2 තැන්පතු හා ලැබීම්** | | |
| තැන්පතු සඳහා ලැබීම් | 9,766,198 | 14,099,073 |
| අමතර වෙනත් ලැබීම් | 499,990 | 514,056 |
| | **10,266,188** | **14,613,129** |
| **19.3 විකුණුම් පාලන ගිණුම** | | |
| විකුණුම් පාලන ගිණුම | (4,673,971) | (2,157,001) |
| | **(4,673,971)** | **(2,157,001)** |
| **20. මුදල් හා මුදල්වලට සමාන දෑ** | | |
| බැංකුවේ ඇති මුදල් | 30,841,763 | 27,553,571 |
| මාර්ගස්ථ මුදල් | 530,716 | 1,893,709 |
| අතැති මුදල් | 86,873 | 58,950 |
| | **31,459,352** | **29,506,231** |

මුදල් ගලා ඒම, මුදල් සහ මුදල් හා සමාන ප්‍රකාශනය සඳහා වන තොරතුරු පහත පරිදි වේ.

| | **2019**<br>රු. | **2018**<br>රු. |
|---|---|---|
| බැංකුවේ ඇති මුදල් | 30,841,763 | 32,987,997 |
| මාර්ගස්ථ මුදල් | 530,716 | 1,893,709 |
| අතැති මුදල් | 86,873 | 58,950 |
| | **31,459,352** | **34,940,656** |
| බැංකු අයිරා | (19,702,073) | (51,448,858) |
| | **11,757,279** | **(16,508,202)** |
| 21. **බැංකු ණය - දිගු කාලීන** | | |
| 2019. 01. 01 දිනට ආරම්භක ශේෂය | 174,000,236 | 185,000,000 |
| වර්ෂය තුළ ණය සඳහා ගෙවීම් | (37,358,097) | (10,999,764) |
| වර්ෂය අවසානයට ශේෂ | **136,642,139** | **174,000,236** |
| 22. **වෙළඳ ගෙවීම්** | | |
| වෙළඳ ණය හිමියන් | 47,478,490 | 42,230,180 |
| වෙනත් ණය හිමියන් | 1,805,999 | 1,510,615 |
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 189,965,706 | 129,399,160 |
| විකුණුම් අත්තිකාරම් | 16,194 | 16,194 |
| වෙනත් ණය හිමියන් (හර ශේෂය) | 1,279,658 | 1,279,659 |
| | **240,546,047** | **174,435,807** |
| 23. **වෙනත් ගෙවීම්** | 70,079,065 | 44,848,338 |
| උපචිත වියදම් | 1,805,962 | 1,471,534 |
| තැන්පතු ගෙවීම් | **71,885,027** | **46,319,872** |
| 24. **කෙටි කාලීන බැංකු ණය (පොළී සහිත)** | | |
| කෙටි කාලීන බැංකු ණය (STL) | | |
| 2019.01.01 දිනට ආරම්භක ශේෂය | 770,860,679 | 697,050,043 |
| ලබා ගත් ණය මුදල | 1,094,567,698 | 744,249,820 |
| ණය ගෙවීම් | (1,024,710,779) | (670,439,184) |
| 2019.12.31 දිනට අවසාන ශේෂය | **840,717,598** | **770,860,679** |

# 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය** | (169,428,397) | (406,985,154) |
| බදු පෙර ලාභය | | |
| ගැළපීම්: | | |
| ස්ථාවර වත්කම් ක්ෂය | 61,465,802 | 61,107,084 |
| ජංගම නොවන වත්කම් විකුණුම් ලාභය | - | - |
| පෙර වර්ෂයේ ගැළපීම් | (32,297,590) | - |
| මූල්‍ය වියදම් | 149,163,926 | 110,486,874 |
| පාරිතෝෂික සඳහා වසර තුළ වෙන්කළ ප්‍රතිපාදන | 6,545,373 | 47,483,284 |
| අ.ප්‍ර.දෙ. ප්‍රමාද ගාස්තු සඳහා වෙන් කිරීම | 9,028,466 | - |
| බොල්ණය සඳහා වෙන් කිරීම | 5,597,804 | 3,466,949 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | **30,075,384** | **(184,440,963)** |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම** | | |
| තොගය (වැඩිවීම) / අඩුවීම | 163,365,732 | (185,787,734) |
| විලම්බිත බදු (වැඩිවීම) / අඩුවීම | (5,538,465) | (298,355) |
| (වැඩිවීම්)/වෙළඳ ලැබීම් අඩුවීම | (108,206,398) | 221,696,364 |
| (වැඩිවීම්)/වෙනත් ලැබීම්වල හා අත්තිකාරම් තැන්පතුවල අඩුවීම | 17,049,570 | 1,165,252 |
| ජංගම බැරකම්වල වැඩි/(අඩුවීම) | 93,375,394 | 6,189,325 |
| **මෙහෙයුම් කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය** | **190,121,217** | **(141,476,112)** |
| ගෙවූ බදු | (1,700,000) | (298,355) |
| සේවක විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීම | (29,993,918) | (21,040,179) |
| **මෙහෙයුම් කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය** | **158,427,299** | **(162,814,646)** |
| **ආයෝජන කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය** | | |
| ස්ථාවර වත්කම් අලෙවිය තුලින් ජනනය වූ | - | - |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම් තුලින් ජනනය වූ | (13,496,714) | (6,819,302) |
| **ආයෝජන කටයුතුවලින් ශුද්ධ මුදල් ගලාඒම** | **(13,496,714)** | **(6,819,302)** |
| **මූල්‍ය කටයුතුවලින් මුදල් ගලා ඒම** | | |
| ණය ලබා ගැනීම/ගෙවීම් තුලින් (ශුද්ධ ණය) | 32,498,822 | 245,663,912 |
| පොළී ගෙවීම් | (149,163,926) | (110,486,874) |
| **මූල්‍ය කටයුතුවලින් ශුද්ධ මුදල් ගලා ඒම** | **(116,665,104)** | **135,177,038** |
| **ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්) මුදල් හා මුදල්වලට සමාන දෑ** | **28,265,481** | **(32,309,951)** |
| **කාලසීමාව ආරම්භයේ මුදල් හා මුදල්වලට සමාන දෑ** | **(16,508,202)** | **15,801,749** |
| **කාලසීමාව අවසානයේ මුදල් හා මුදල්වලට සමාන දෑ (සටහන 19)** | **11,757,279** | **(16,508,202)** |

## 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය

| | ප්‍රාග්ධන නිකුතුව රු. | ප්‍රාග්ධන සංචිතය රු. | පොදු සංචිතය රු. | සංවර්ධන සංචිතය රු. | ප්‍රත්‍යාගණන ලාභය රු. | රඳවාගත් ඉපැයීම් සංචිත රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|
| 2018 ගිණුම් | | | | | | | |
| 2018. 01. 01 වැනි දිනට ශේෂය | 15,000,000 | 102,491 | 1,000,000 | 13,901,142 | 808,012,812 | (44,752,462) | **793,263,982** |
| පෙර වර්ෂයේ ගැළපීම් | | | | | | 4,904,493 | **4,904,493** |
| ලාභය/(පාඩුව) වසර සඳහා (බදු පසු) | | | | | | (406,985,154) | **(406,985,154)** |
| ප්‍රත්‍යාගණන ලාභය | | | | | (1,105) | | **(1,105)** |
| 2018. 12. 31 දිනට ශේෂය | **15,000,000** | **102,491** | **1,000,000** | **13,901,142** | **808,011,707** | **(446,833,123)** | **391,182,216** |
| 2019 ගිණුම් | | | | | | | |
| 2019. 01. 01 දිනට ශේෂය | 15,000,000 | 102,491 | 1,000,000 | 13,901,142 | 808,011,707 | (446,833,123) | **391,182,216** |
| පෙර වර්ෂයේ ගැළපීම් | | | | | | (32,297,591) | **(32,297,591)** |
| ලාභය/(පාඩුව) වසර සඳහා (බදු පසු) | | | | | | (169,428,397) | **(169,428,397)** |
| ප්‍රත්‍යාගණන ලාභය | | | | | | | **0** |
| 2019. 12. 31 දිනට ශේෂය | **15,000,000** | **102,491** | **1,000,000** | **13,901,142** | **808,011,707** | **(648,559,112)** | **189,456,228** |

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

## 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශය

| | සටහන් | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| ආදායම | 7 | 1,593,815,189 | 901,053,747 |
| විකුණුම් පිරිවැය | 8 | (1,320,149,485) | (903,841,823) |
| **දළ ලාභය** | | **273,665,704** | **(2,788,076)** |
| වෙනත් මෙහෙයුම් ආදායම | 9 | 20,065,417 | 17,870,270 |
| බෙදාහැරීමේ වියදම් | 10 | (35,307,657) | (16,787,874) |
| පරිපාලන වියදම් | 11 | (188,662,632) | (234,414,704) |
| වෙනත් මෙහෙයුම් සඳහා වියදම් | 12 | (92,281,928) | (62,818,995) |
| මෙහෙයුම් ලාභය | | (22,521,097) | (298,939,379) |
| මූල්‍ය ආදායම | | 2,256,626 | 2,441,100 |
| මූල්‍ය වියදම් | 13 | (149,163,926) | (110,486,874) |
| **බදු පෙර ලාභය** | | **(169,428,397)** | **(406,985,154)** |
| ආදායම් බදු | 14 | - | - |
| **බදු පසු ලාභය** | | **(169,428,397)** | **(406,985,154)** |

## 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය

| | 2019 රු. | 2018 රු. |
|---|---|---|
| වාර්ෂික ලාභය (බදු පසු) | **(169,428,397)** | **(406,985,154)** |
| වෙනත් විස්තීරණ ආදායම් | **-** | **-** |
| ප්‍රත්‍යාගණන ලාභය | **-** | **(1,105)** |
| වර්ෂය තුළ මුළු විස්තීරණ ආදායම් | **(169,428,397)** | **(406,986,259)** |

# 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

| | 2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|
| **07. ආදායම්** | | |
| ලිපිද්‍රව්‍ය කර්මාන්තශාලාවෙන් ලද ආදායම | 166,442,486 | 221,627,632 |
| ප්‍රධාන මුද්‍රණාලයෙන් ලද ආදායම | | |
| පෙළ පොත් | 979,237,857 | 289,029,668 |
| ජොබ් වැඩ (වාණිජ මුද්‍රණ කටයුතු) | 157,645,499 | 360,241,485 |
| ජා.ලො.ම. ලොතරැයිපත් | 268,941,482 | - |
| ප්‍රකාශන | 2,872,246 | 4,786,835 |
| වෙනත් අලෙවි කටයුතුවලින් ලද ආදායම | 18,675,619 | 25,368,128 |
| | **1,593,815,189** | **901,053,747** |
| **08. විකුණුම් පිරිවැය** | | |
| **ප්‍රධාන මුද්‍රණාලය** | | |
| පරිභෝජනය කළ ද්‍රව්‍ය | 629,573,639 | 407,630,135 |
| සෘජු ශ්‍රමය | 189,321,830 | 187,570,249 |
| සෘජු කර්මාන්තශාලා වියදම් | 43,412,565 | 36,149,507 |
| වක්‍ර කර්මාන්තශාලා වියදම් | 88,242,585 | 91,829,708 |
| අනෙකුත් වියදම් / තොග ගැළපීම් | 105,170,522 | (74,060,062) |
| ප්‍රමාද ගෙවීම් තත්ත්ව හානි හා දඩ (අ. ප්‍ර. දෙ.) | 69,264,953 | 38,262,345 |
| ප්‍රමාද ගෙවීම් හා දඩ (ජා.ලො.ම.) | 8,481,350 | 10,181,000 |
| අ.ප්‍ර.දෙ. ප්‍රමාද ගාස්තු සඳහා වෙන්කිරීම් | 9,028,466 | - |
| | **1,142,495,910** | **697,562,880** |
| **ලිපිද්‍රව්‍ය කර්මාන්තශාලාව** | | |
| පරිභෝජනය කළ ද්‍රව්‍ය | 101,065,522 | 129,481,819 |
| සෘජු ශ්‍රමය | 30,348,260 | 29,708,956 |
| සෘජු කර්මාන්තශාලා වියදම් | 2,391,960 | 3,277,672 |
| වක්‍ර කර්මාන්තශාලා වියදම් | 8,927,598 | 8,710,140 |
| අනෙකුත් වියදම් / තොග ගැළපීම් | 14,819,655 | 9,533,639 |
| | **157,552,995** | **180,712,225** |
| **ප්‍රකාශන අංශයේ පිරිවැය** | 5,336,363 | 4,237,183 |
| **අනෙකුත් අලෙවි අංශවල පිරිවැය** | 14,764,217 | 21,329,535 |
| **මුළු විකුණුම් පිරිවැය** | **1,320,149,485** | **903,841,823** |
| **09. වෙනත් මෙහෙයුම්වලින් ලද ආදායම** | | |
| මුද්‍රණාලීය අබලි කොල සහ අනෙකුත් ද්‍රව්‍ය | 19,010,602 | 17,463,220 |
| ටෙන්ඩර් තැන්පතු සහ ලියාපදිංචි | 1,042,015 | 387,850 |
| ආපන ශාලාවෙන් ලද ආදායම | 12,800 | 19,200 |
| | **20,065,417** | **17,870,270** |

| | 2019 | 2018 |
|---|---|---|
| | රු. | රු. |
| **10. බෙදාහැරීම් වියදම්** | | |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 15,450,486 | 7,364,166 |
| ආර්ථික සේවා බදු | 7,969,075 | - |
| මෝටර් රථවාහන නඩත්තුව | 4,746,399 | 5,027,606 |
| දැන්වීම් සඳහා | 518,688 | 254,648 |
| අලෙවි ප්‍රවර්ධන කටයුතු | 800,841 | 391,585 |
| බොල් ණය සඳහා ප්‍රතිපාදන | 5,597,804 | 3,466,949 |
| අලෙවිසැල නඩත්තු කිරීමට | - | 2,350 |
| ගිනි රක්ෂණය - අලෙවිසැල් | 59,752 | 60,007 |
| විකුණුම් කොමිස් | 60,009 | - |
| නිමි තොග ප්‍රවාහය | 4,258 | 10,750 |
| නැවත නොගෙවන ටෙන්ඩර් තැන්පතු | 100,345 | 209,813 |
| | **35,307,657** | **16,787,874** |
| **11. ආයතන හා පරිපාලන වියදම්** | | |
| කුලී | 3,451,975 | 3,482,711 |
| ඉඩම් හා ගොඩනැගිලි නඩත්තු | 466,112 | 576,623 |
| විදුලිය | 133,656 | 178,561 |
| කාර්යාල උපකරණ නඩත්තුව | 541,526 | 395,530 |
| ක්ෂයවීම් - කාර්යාලයීය උපකරණ | 1,325,311 | 1,043,964 |
| - පරිගණක උපාංග | 1,928,133 | 1,921,470 |
| - යතුරුපැදි | 64,375 | 64,375 |
| වරිපනම් | 94,575 | 41,487 |
| ජල ගාස්තු | 51,566 | 67,813 |
| වැටුප් හා වේතන | 127,816,664 | 129,973,241 |
| අතිකාල දීමනා | 8,809,290 | 9,824,898 |
| සේවක අර්ථසාධක අරමුදල | 16,067,361 | 16,507,035 |
| සේවක භාරකාර අරමුදල | 4,016,842 | 4,127,500 |
| දිරි දීමනා | 1,949,750 | 2,115,250 |
| සභාපති වේතනය | 447,229 | 598,771 |
| ක්‍රියාකාරී අධ්‍යක්ෂ වේතනය | 416,116 | 569,869 |
| අධ්‍යක්ෂ ගාස්තු | 388,450 | 453,500 |
| තැපැල් ගාස්තු | 232,264 | 255,824 |
| දුරකථන | 1,227,298 | 1,580,108 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 2,479,384 | 1,972,015 |
| පුවත්පත් දැන්වීම් හා ප්‍රකාශන | 1,001,025 | 504,385 |
| ප්‍රවාහනය හා යැපුම් දීමනා | 1,210,284 | 1,191,440 |
| පුවත්පත් හා වාර සඟරා | 116,920 | 270,270 |
| පොදු කාර්යාලයීය වියදම් | 214,241 | 163,917 |
| විගණන වියදම් | 443,573 | 500,000 |
| විවිධ වියදම් | 95,255 | 45,988 |
| නෛතික හා උපදේශන සේවා | 80,679 | 18,136 |
| වින්දනාත්මක කටයුතු | 132,559 | 377,176 |
| පාරිතෝෂික වියදම් | 6,545,373 | 47,483,284 |
| සේවක පුහුණු කිරීම් | 442,120 | 328,000 |
| විගණන හා කළමනාකරණ කමිටු ගාස්තු | 129,000 | 38,250 |
| අන්තර්ජාල / විද්‍යුත් තැපැල | 184,670 | 141,886 |
| ටෙන්ඩර් මණ්ඩල තාක්ෂණික කමිටු වියදම් | 600,000 | 2,190,000 |
| 25% මෝටර් රථවාහන නඩත්තුව | 4,746,399 | 5,027,606 |

| | 2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|
| නවාතැන් පහසුකම් | - | 48,430 |
| අධ්‍යක්ෂ මණ්ඩල හමු සඳහා වියදම් | 28,370 | 32,984 |
| සාමාජික ගාස්තු | 42,000 | 41,310 |
| පරිත්‍යාග | 390,973 | 46,783 |
| පරිගණක අලුත්වැඩියා හා නඩත්තු ගාස්තු | 256,500 | 144,550 |
| සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු | 94,815 | 69,768 |
| | **188,662,632** | **234,414,704** |
| **12. වෙනත් මෙහෙයුම් වියදම්** | | |
| සේවක සුභසාධනය | 21,171,114 | 24,203,913 |
| සේවක වෛද්‍ය පහසුකම් | 9,430,899 | 10,046,219 |
| කාර්ය මණ්ඩල ප්‍රවාහනය | 8,503,040 | 13,615,290 |
| කාර්ය මණ්ඩලය සඳහා ප්‍රසාද දීමනා | 22,097,071 | 1,408,369 |
| විශේෂ දිරි දීමනා | 15,675,000 | - |
| නිවාඩු සඳහා ගෙවීම් | 13,210,825 | 10,879,168 |
| නිවාස ණය පොලී | 2,087,229 | 2,573,035 |
| කාර්ය මණ්ඩල සම්මාන | 106,750 | 93,000 |
| | **92,281,928** | **62,818,995** |
| **13. මූල්‍ය වියදම්** | | |
| බැංකු ගාස්තු හා බැංකු ඇපකර ගාස්තු | 9,877,393 | 2,349,948 |
| බැංකු අයිරා පොලී | 6,142,227 | 5,347,406 |
| බැංකු ණය පොලී - කෙටි කාලීන | 111,597,091 | 88,917,227 |
| බැංකු ණය පොලී - දිගු කාලීන | 21,547,216 | 13,872,293 |
| | **149,163,926** | **110,486,874** |
| **14. ආදායම් බදු** | | |
| වසර සඳහා ආදායම් බදු ප්‍රතිපාදන | - | - |
| | - | - |

# 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

**15.** දේපළ, පිරියත සහ උපකරණ

| විස්තරය | ප්‍රත්‍යාගණනය 01. 01. 2018 | වර්ෂය තුළ එකතුවීම් හා ප්‍රත්‍යාගණනය | වර්ෂය තුළ ඉවත් කිරීම් | ප්‍රත්‍යාගණන/ පිරිවැය 31. 12. 2018 | වර්ෂය තුළ ඉවත් කිරීම් | පිරිවැය/ ප්‍රත්‍යාගණනය 01. 01. 2019 | වර්ෂය තුළ එකතුවීම් 2019 | 2019. 12. 31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|
| පිරිවැයට | | | | | | | | |
| ඉඩම් | 378,500,000 | - | - | 378,500,000 | - | 378,500,000 | - | 378,500,000 |
| ගොඩනැගිලි | 166,600,000 | - | - | 166,600,000 | - | 166,600,000 | - | 166,600,000 |
| * පිරියත හා යන්ත්‍රෝපකරණ | 530,127,704 | 5,229,372 | - | 535,357,077 | - | 535,357,077 | 10,609,349 | 545,966,426 |
| මෝටර් හා වෙනත් වාහන | 55,563,000 | - | - | 55,563,000 | - | 55,563,000 | - | 55,563,000 |
| ** කාර්යාලයීය උපකරණ | 9,328,893 | 1,504,940 | - | 10,833,834.00 | - | 10,833,834 | 2,887,365 | 13,721,199 |
| පරිගණක හා උපාංග | 5,700,220 | 84,990 | - | 5,785,210 | - | 5,785,210 | - | 5,785,210 |
| ඉලෙක්ට්‍රොනික ප්‍රතිස්ථාපන | 2,572,951 | - | - | 2,572,951 | - | 2,572,951 | - | 2,572,951 |
| **එකතුව** | **1,148,392,769** | **6,819,302** | **-** | **1,155,212,072** | **-** | **1,155,212,072** | **13,496,714** | **1,168,708,786** |
| **සමුච්චිත ක්ෂය වීම්** | | | | | | | | |
| විස්තරය | **Revaluations/C for the Year 01.01.2018** | **Annual Depreciation 2018** | **Disposals during the year** | **Accumulated Depreciation 31.12.2018** | **Disposals during the year** | **Revaluations/ Cost 01.01.2019** | **Annual Depreciation 2019** | **Accumulated Depreciation 31.12.2019** |
| ගොඩනැගිලි | 4,165,000 | 4,165,000 | - | 8,330,000 | - | 8,330,000 | 4,165,000 | 12,495,000 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 25,042,347 | 40,085,900 | } - | 65,128,247 | - | 65,128,247 | 40,156,610 | 105,284,857 |
| මෝටර් රථ හා මෝටර් සයිකල් | 20,838,125 | 13,890,750 | | 34,728,875 | - | 34,728,875 | 13,890,750 | 48,619,625 |
| කාර්යාලයීය උපකරණ හා ලී බඩු | 676,348 | 1,043,964 | - | 1,720,312 | - | 1,720,312 | 1,325,310 | 3,045,622 |
| පරිගණක හා උපාංග | 1,715,910 | 1,921,470 | } - | 3,637,380 | - | 3,637,380 | 1,928,132 | 5,565,512 |
| ඉලෙක්ට්‍රොනික ප්‍රතිස්ථාපන | 2,572,950 | - | - | 2,572,950 | - | 2,572,950 | - | 2,572,950 |
| **එකතුව** | | **61,107,084** | **-** | **116,117,763** | **-** | **116,117,763** | **61,465,802** | **177,583,565** |
| ලියා හල අගය | | | | **1,039,094,309** | | | | **991,125,221** |

* / ** revalued under one category during the year

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | එම්ආර්ඩී/ඩී/එස්පීසී/ 1 /19/154 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2020 අගෝස්තු 25 දින |

සභාපති
රාජ්‍ය මුද්‍රණ සංස්ථාව

**රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්වාගණනය කළ මතය**

රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් සහ සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන වන බලපෑම හැර, සංස්ථාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01හි 79 (ආ) ඡේදය ප්‍රකාරව ප්‍රාග්ධනය තුළ ඇතුළත් සංචිතයන්ගේ ස්වභාවය, පවත්වාගෙන යාමේ අරමුණ ආදිය පිළිබඳව හෙළිදරව් කිරීම අවශ්‍ය වුවද සංස්ථාව විසින් පවත්වාගෙන යනු ලබන රු. 102,491ක් වූ ප්‍රාග්ධන සංචිතය, රු 1,000,000 ක් වූ පොදු සංචිතය හා රු. 13,901,142 ක් වූ සංවර්ධන සංචිතය පිළිබඳව හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 12 හි 81 (ඇ) අනුව බද්ද වියදම් (ආදායම්) සහ ගිණුම්කරණ ලාභය අතර සම්බන්ධතාවය පැහැදිලි කරමින් සංඛ්‍යානමය සැසඳුමක් පිළියෙල කල යුතු අතර අදාල වන බදු අනුපාතයන් හෙළිදරව් කිරීමද කල යුතු වුවද සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශයන් තුළ එසේ හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ ප්‍රධාන මුද්‍රණාලයේ සහ ලිපිද්‍රව්‍ය කර්මාන්ත ශාලාවේ අමුද්‍රව්‍ය මිලදී ගැණුම් වටිනාකම, පිරිවැය අංශයේ වාර්තා අනුව රු. 614,714,346 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එය රු. 622,633,861 ක් ලෙස දක්වා තිබීමෙන් නිෂ්පාදන පිරිවැය රු. 7,919,515 කින් වැඩියෙන් දක්වා තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ ප්‍රධාන මුද්‍රණාලයේ සහ ලිපිද්‍රව්‍ය කර්මාන්ත ශාලාවේ පරිභෝජනය කල අමුද්‍රව්‍ය පිරිවැය, පිරිවැය වාර්තා අනුව රු. 722,757,688 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු. 730,639,160 ක් ලෙස දක්වා තිබීමෙන් නිෂ්පාදන පිරිවැය රු. 7,881,472කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අමුද්‍රව්‍ය මිලදී ගැනීම් යටතට එකතුව රු. 1,034,813 ක් වූ එකතු කළ අගය මත බදු ගැලපීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ගැණුම් එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ අමුද්‍රව්‍ය මිලදීගැනීම් වලට අදාල එකතු වටිනාකම රු. 4,788,039 ක්වූ දේශීය නියෝජිත කොමිස් වියදම් ගිණුම් ගතකර නොතිබුණි.

(ඊ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම නොවන වත්කම් තුල ඇතුළත් රු. 17,105,398 ක් වූ විලම්භිත බදු ශේෂය සනාථ කිරීම සඳහා ගණනය කිරීම් ඇතුළත් විස්තරාත්මක තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(උ) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද ශේෂ සනාථ කිරීම් අනුව එම දෙපාර්තමේන්තුවට රු. 8,324,416 ක් අයවීමට ඇති බව දන්වා තිබුණද මූල්‍ය ප්‍රකාශන අනුව එය රු. 4,012,020 ක් වූයෙන් රු. 4,312,396 ක වෙනසක් විය.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට ජාතික කඩදාසි සමාගමෙන් සංස්ථාව වෙත රු. 9,753,427 ක් අයවීමට තිබු අතර සංස්ථාව විසින් කඩදාසි සමාගමට ගෙවිය යුතු මුදල රු. 7,460,675 ක් වී තිබුණි. මෙම ශේෂ තුළ වර්ෂ 06 ඉක්මවූ ණය මුදල පිළිවෙලින් රු. 7,989,976 ක් සහ රු. 5,578,142 ක් වූ නමුත් මෙම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වන්නා වූ අවදානම් මගහරවා ගැනීමට ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර , දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ උචිතත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළයුතු අතර , එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

  - 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් ඇති බව.

  - 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව.

  - 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (ඓ) ඡේදය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අනාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2015 මැයි 25 දිනැති අංක PED 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 4.2 ඡේදය | සංස්ථාවේ මධ්‍ය මට්ටමේ කළමණාකරුවන් 17 දෙනෙකු සඳහා කණ්ඩායම් ප්‍රවාහන සේවය සැපයීමට කටයුතු නොකර ඒ වෙනුවට එක් අයෙකුට මාසිකව රු. 17,500 බැගින් සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු. 3,284,798 ක දීමනා ගෙවා තිබුණි. |
| (ආ) 2018 දෙසැම්බර් 07 දිනැති අංක PED 03/2018 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ගෙවිය හැකි ප්‍රසාද දීමනා මුදල රු.1,716,000 ක් වුවද එකතුව රු. 22,097,071 ක් ගෙවීම සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රතිපාදනය කර තිබුණි. |

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

## 3 වෙනත් විගණන නිරීක්ෂණ

(අ). වර්ෂ 05ක් හා ඊට වැඩි එකතුව රු.170,893,188 ක් වූ වෙළඳ ණයගැති ශේෂ අයකර ගැනීමට සංස්ථාව අපොහොසත්වී තිබුණු අතර එය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති මුළු ණයගැතියන්ගෙන් සියයට 39 ක් විය.

(ආ). පාසල් පොත් මුද්‍රණය කිරීම සහ ලොතරැයි මුද්‍රණය කිරීම වෙනුවෙන් පිළිවෙලින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් සහ ජාතික ලොතරැයි මණ්ඩලයෙන් රු. 979,237,857 ක් සහ රු. 268,941,482 ක් වශයෙන් එකතුව රු. 1,248,179,339 ක ආදායමක් ලැබී තිබුණි. එය වර්ෂයේ සමස්ථ ආදායම වූ රු. 1,593,815,189 න් සියයට 78 ක් වූ බැවින් සංස්ථාව සිය ආදායම් මූලාශ්‍ර විවිධාංගීකරණය නොකර ආදායම් මූලාශ්‍ර දෙකක් පමණක් මත පදනම්ව කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය.

(ඈ). 2020 වර්ෂය සඳහා පාසල් පෙළපොත් මුද්‍රණය කර භාරදීම සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව සමඟ ඇතිකරගත් ගිවිසුම්වලට පටහැනිව දින 02 සිට දින 70 දක්වා කාල ප්‍රමාදයකින් පසුව මුද්‍රණය කරන ලද පාසල් පෙළපොත් භාරදීම හේතුවෙන් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සංස්ථාවට ගෙවිය යුතු මුදලින් රු. 69,317,151 ක් ප්‍රමාද ගාස්තු වශයෙන් අයකරගෙන තිබුණි.

(ඇ). සංස්ථාවේ මුද්‍රණ කටයුතු සඳහා සෘජුවම බලපාන මධ්‍ය මට්ටමේ කළමනාකරුවන් 05ක්, කණිෂ්ඨ මට්ටමේ 12ක්, විකුණුම් මධ්‍යස්ථාන භාර නිලධාරීන් 08ක් ඇතුළුව සහකාර නිලධාරීන් 12ක් සහ කළමනාකාර සහකාර (තාක්ෂණ) නිලධාරී 78ක් වශයෙන් නිලධාරීන් 107 කගේ තනතුරු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට පුරප්පාඩුව පැවතුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

2019

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්වාගණනය කළ මතය**

තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) සංස්ථාව ආරම්භක අවස්ථාවේදී පටන් මෙම සංචිතය පිහිටුවා තිබූ අතර අවසන් ගිණුම්වල අංක 4.3.1 යටතේ තොරතුරු සටහන් කර ඇත.

(ආ) සංස්ථාව සමාලෝචිත වසරේ මෙන්ම පසුගිය වසර කිහිපය පුරාවට අලාභදායී තත්වයක් උපයාගෙන තිබූ බැවින් ආදායම් බදු අගය ශූන්‍ය වූ නිසා මෙන්ම බදුගෙවීම සඳහා බදු ආදායම් තත්වයක් ද වාර්තා නොවුනු බැවින්, බදු ආදායම් ගණනය කිරීමක් කොට සංසන්දනාත්මකව ඉදිරිපත් කර නොමැත.

(ඇ) මෙය සංස්ථාවේ ගිණුම් කටයුතු අතින් (Manual) සිදුකිරීම නිසා ඇතිවූ වෙනසක් මිස සිදු වී ඇති ගිණුම්කරණ දෝෂයක් නොවේ. පෙර සිටම සංස්ථා මූල්‍ය ප්‍රකාශණහි අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ පිරිවැය සැකසීම සඳහා සංස්ථාව විසින් පාදක කරගනු ලබන්නේ පිරිවැය අංශයේ වාර්තා පමණක් නොවන අතර, අමුද්‍රව්‍ය මිලදී ගැනීමේදී එයට සිදුකරනු ලබන සියලුම ගෙවීම් හා එයට අදාළ උපචිත ගෙවීමක් ඇතොත් එය මුදල් අංශයේ ගෙවීම් අංශයෙන් යාවත්කාලීන කොට අමුද්‍රව්‍ය මිලදී ගැනීම් ගිණුමට ගලපනු ලැබේ. එය අවසන් ගිණුම් සඳහාද අදාළ කර ගනු ලබයි.

පිරිවැය අංශයට ගැණුම් ලෙස ගනු ලබන ජාත්‍යන්තර මිලදී ගැනීම්වලට අදාළ ඇතැම් සුළු ගෙවීම් හා ගාස්තු බොහෝමයක් කල්ගතවී හඳුනා ගනු ලබන බැවින්, ඒ වනවිටත් එම අමුද්‍රව්‍ය පරිභෝජනය කොට පාරිභෝජන වියදම් ලෙසද දක්වා ඇති බැවින්, ඒවා වෙන වෙනම හඳුනාගෙන යාවත්කාලීන කිරීම ප්‍රායෝගික ගැටළුවක් වී තිබේ. එබැවින් පිරිවැය අංශයේ අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ වාර්තා සංස්ථා මූල්‍ය ප්‍රකාශන සැකසීම සඳහා මූලිකවම යොදා නොගෙන, යාවත්කාලීන වූ ගිණුම් අංශයේ අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ පිරිවැය ඒ සඳහා පාදක කරගනු ලබයි.

සමාලෝචිත ගිණුම් වර්ෂයේ සංස්ථාව විසින් රුපියල් මිලියන 730 ක් පමණ විශාල වටිනාකමකින් යුතු අමුද්‍රව්‍ය වසර පුරාම අවස්ථා ගණනාවකදී පරිභෝජනය කර ඇති බැවින්, ඒවායේ ඇතැම් කුඩා ගෙවීම් හා ගාස්තු පිරිවැය අංශයේ මිලදී ගැනීම්වලට ඇතුලත් නොවන අවස්ථාද දැක ගත හැකියි. මන්දයත් පිරිවැය අංශය විසින් අදාළ අමුද්‍රව්‍ය මිලට ගැනීමේ පිරිවැය සකසනු ලබනුයේ සැපයුම් අංශය ඔවුනට ලබාදෙනු ලබන පිරිවැය පත්‍රිකාවක් (cost sheet) පාදක කර ගෙනය. එයට ඇතැම් අවස්ථාවලදී අමුද්‍රව්‍ය ගෙන ඒමේ ගාස්තු, බදු ගණන වෙනස්කම්, රක්ෂණ ගාස්තු, ලිපිකාර ගාස්තු බැංකු ගාස්තු වල ඇතැම් වියදම්, පැටවීමේ හා බෑමේ ගාස්තු, බහාලුම් ගාස්තු වැනි යම්යම් ගාස්තු මග හැරී තිබෙනු දැක ගත හැක. එසේම ගෙවා ඇති සමහර ගාස්තු පසුව ආපසු ගෙවා ඇති අවස්ථා නිරීක්ෂණය වේ. උදාහරණ ලෙස බහාලුම් ගාස්තු දැක්විය හැක. එහෙත් ගිණුම් අංශය අදාළ සියලුම ගෙවීම් හා යාවත්කාලීන වන බැවින්ද වසර අවසානයේ ඒවාට අදාළ උපචිත ගෙවීම්ද ඇතොත් ඒවාද ඇතුලත් කොට අමුද්‍රව්‍ය මිලදී ගැනීම් පිරිවැය සකසන බැවින්, එය අවසන් ගිණුම් සඳහා නිවැරදිව සටහන් කොට ඇත. පිරිවැය අංශයට ජාත්‍යන්තර වෙළඳාමට අදාළ එම මග හැරෙන ගණුදෙණු ක්ෂණිකව ලබාදීම ප්‍රායෝගික ව අපහසුය. (අදාළ වියදම් සිදුවන විට මාස කිහිපයක් ගෙවී ගොස් ඇති නිසා මෙන්ම එම මිලට ගත් අමුද්‍රව්‍ය පරිභෝජනය කර ඇති නිසා)

සංස්ථා අමුද්‍රව්‍ය පරිභෝජනය ගණනය කිරීම සඳහා පමණක් සංස්ථාවේ පරිගණකගත ක්‍රමවේදයක් නොමැති බැවින් අමුද්‍රව්‍ය මිලට ගැණුම් පිරිවැය සකසනු ලබයි. මෙහිදී මෙම සියලුම වියදම් ඇතුලත් කොට එම පිරිවැය, පිරිවැය අංශයේ සකසනු ලබන නමුදු ඉහත කී පරිදි විදේශීය ගැණුම් වල යම් යම් වියදම් ප්‍රමාණයක් ඇතුලත් කිරීම මහගැරී යනු ඇත. එහෙත් ගිණුම් අංශයේ අමුද්‍රව්‍ය මිලට ගැණුම්හි පිරිවැය නිවැරදිව ගණනය වන බැවින් එය අවසන් ගිණුම්වලට ගනු ලබයි.

ඉහත පරිදි පිරිවැය අංශයේ අමුද්‍රව්‍ය පිරිවැයහි වටිනාකම අඩුවෙන් ගණනයවන නිසා එම පිරිවැය අංශයේ අමුද්‍රව්‍ය පරිභෝජනයන්හි වටිනාකමද (සියල්ලම පාහේ පරිභෝජනය කර ඇති නිසා) ඒ හා සමාන අගයකින් අඩුවෙන් පවතී. එබැවින් පරිභෝජන වියදම ද පිරිවැය අංශයේ පිරිවැය වාර්තා වල අඩුවෙන් සටහන්කර ඇත. එහෙත් අවසන් ගිණුම්වලට එය නිවැරදි අගය ගලපා ඇත. (ගිණුම් අංශයේ අමුද්‍රව්‍ය මිලට ගැනීම් පිරිවැය අංශයේ පිරිවැයට වඩා සමාලෝචිත වසරේදී රු. 7,919,513.01 ක අගයක් දැක ගත හැක. එබැවින් පරිභෝජනය කොට ඇත. අමුද්‍රව්‍ය වල වටිනාකම  රු. 7,881,472 කින් අඩුවෙන් දක්වා ඇති අතර එයද නිවැරදිව අවසන් ගිණුම්වලට ගලපා ඇත. මෙම 'ඇ' විමසුමේ සමස්ත ප්‍රතිඵලය ගැලපුම් කළවිට එහි අගය රු. 38,043/- ක් වේ. එනම් අමුද්‍රව්‍ය නිෂ්පාදන පිරිවැයෙන් 0.48% කි.

ගබඩාවේ බින්කාඩ් පත්‍රයට සාපේක්ෂව අමුද්‍රව්‍ය තොග පාලනය සඳහා පිරිවැය අංශයේ පවත්වාගෙන යනු ලබන ලෙජරය හා ගිණුම් අංශයේ ගැණුම් ලෙජරය අතර මෙවැනි වෙනස්කම් තිබීම ප්‍රායෝගික කරුණක් වන අතර අමුද්‍රව්‍ය පරිභෝජනය මූල්‍ය ගිණුම්වලට ඇතුළත් කිරීම මෙහි ප්‍රධාන කාර්ය භාරය වේ.

සංස්ථා අවසන් තොගය භෞතිකව ගණනය කොට (ඇතුලත් නොවී ඇති වියදම්ද ඇතොත් ඒවාද ඇතුලත් කොට) ශුද්ධ උපලබ්ධි අගයට (NRV) පිරිවැය ගණනය කරනු ලබන නිසා ගිණුම් කරණමය වශයෙන් ලාභයට කිසිදු බලපෑමක් නොවී සත්‍ය අගය ගැලපී ඇත. සංස්ථාව තවමත් ගණුදෙනු කටයුතු පරිගණක ගත කොට නොමැති නිසා මෙයට වඩා වෙනත් විකල්පයක් භාවිතා කිරීම ප්‍රායෝගිකව අපහසුවී ඇත. මෙම හේතූන් නිසාම ERP පරිගණක පද්ධතියක් මිලට ගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇති අතර, එය මේ වනවිට ආරම්භක අවස්ථාවෙහි පවතී.

(ඈ) මෙය බැංකු කපා හැරීම් (Debit Note No 190043) දේශීය ණයවර ලිපි (Local LC) යටතේ සිදුකරනු ලැබූ 2018 හා 2019 වසරට අදාළ ගෙවීමකි. එහි මුදල් වටිනාකම රු. 37,738,580.10 ක් ලෙස දැක්වේ. මෙමගින් මිලදී ගත් අමුද්‍රව්‍ය 2018 වසරට අදාළව රු. 29,812,160/- ක් වන අතර හා ඉතිරි රු. 7,926,419.29 ක මුදල සමාලෝචිත වසරට අදාළ වේ. එහෙත් මෙම අදාළ බදු ඉන්වොයිස් පත (Tax Invoice) 2019 වසරේදී ලබා දී නොතිබූ නිසා එය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් අය බදුලෙස  (Input Tax) ඉල්ලුම් කිරීමට (Claim) නොහැකි බැවින් අදාළ මුළු මුදල අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ පිරිවැය ලෙස ගෙන ඇත.

(ඉ) මෙහිදී අදාළ අමුද්‍රව්‍ය මිලට ගැනීමේ කොමිස් මුදල් අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ ගිණුමට ගිණුම් ගත කිරීම අතපසුවීමකින් සිදුව ඇති අතර, එය නිවැරදි කිරීමට අදාළ කටයුතු කර ඇත.

(ඊ) මෙය පෙර වසරවලින් ඉදිරියට ගෙන ආ ශේෂයක්ද සමග සැදුනු ශේෂයක්වන නිසා ඒ පිළිබඳව කර ඇති බදු ගණනය කිරීමේ ලේඛනය  යාවත්කාලීන නොවීම හා අපසතු දැනුම ද සීමාවීම නිසා එය ඉදිරිපත් කිරීමට නොහැකිවූ අතර ඉදිරියේදී එය යාවත්කාලීන කොට සකසා ඉදිරිපත් කිරීමට කටයුතු කෙරෙමින් පවතී.

(උ) මෙම වෙනසට හේතුව ගිණුම් අංශයේ දෝෂයක් නොව නිෂ්පාදන අංශයෙන් සෘජුවම රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත කරන ලද වැඩවල පිරිවැය වේ. මෙය නිවැරදි කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර ආවරණ අනුමැතියක් ලබා ගැනීමෙන් පසු ගිණුම් අංශයේ පොත් පත් යාවත්කාලීන කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

(ඌ) ජාතික කඩදාසි සංස්ථාවේ නිෂ්පාදනය යළි ආරම්භ කර ඇත. එහෙත් වසර 06 ක් ඉක්මවූ ණය ශේෂ ලබා ගැනීම කඩිනමින් කළ නොහැක. එහෙත් වත්කම් වගකීම්වලට හිලව් කර ශුද්ධ ශේෂය පමණක් පොත්වල පෙන්නුම් කිරීම ප්‍රමිතීන්ට අනුකූලව සිදුකළ නොහැක.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

නීතිරීති හා රෙගුලාසිවලට යොමුව

(අ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක පීඊඩී1/2015 අනුව නිලධාරීන් ප්‍රවාහනය සම්බන්ධව දක්වා ඇති විධි විධාන අනුව මධ්‍යම මට්ටමේ කළමනාකරුවන්ට ප්‍රවාහන පහසුකම් සැළසීමේදී අනුගමනය කළ යුතු ක්‍රමවේදය අනුව සංචිත වාහන භාවිත කරමින් කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් උපරිම කි. මී. 100 ක යාමට සහ ඒමට පහසුකම් සැපයිය යුතුවේ. ඒ අනුව සංස්ථාවේ කාර්යාල අංශය සහ වැඩ අංශය තුළ මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් 18 දෙනෙකු වෙත කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සැලසීමේ ගැටලු තත්ත්වය හේතුවෙන් 2016.08.08 දිනැති 769 වන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ප්‍රවාහන ගැටලු, වාහනවල පවතින ගැටලු සහගත තත්ත්වය සහ ඒ සඳහා දැරීමට සිදුවී ඇති පිරිවැය දක්වමින් ප්‍රවාහන පහසුකම් සැපයීමට යම් නිශ්චිත දීමනාවක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදි.

වර්තමානය වන විටද සංස්ථාවට නිලධාරීන් ප්‍රවාහනය සඳහා නව වාහන මිලදී ගැනීමක් හෝ බාහිරින් වාහන කුළී පදනම මත ලබා ගැනීමේ හැකියාවක් නොමැති බැවින් පිරිවැය ප්‍රතිලාභ සැලකිල්ලට ගනිමින් නිලධාරීන් සඳහා තමන්ගේ මෝටර් රථයක් හෝ ප්‍රවාහන මාධ්‍යයක් භාවිත කිරීම සඳහා මෙම දීමනාව ගෙවීමට කටයුතු කර ඇත. එම නිලධාරීන් හට කිසිදු අවස්ථාවක සේවයට වාර්තා කිරීමට සංස්ථාවේ වාහන භාවිත කිරීමට ප්‍රතිපාදන සළසා නැත.

(ආ) මූලික වශයෙන් සේවක අභිප්‍රේරණය සඳහාත් ඔවුන්ගේ ඉල්ලීම හා බලාපොරොත්තු වලට අනුගතව සේවකයින්ගේ වැඩි ඵලදායකත්වයක් අපේක්ෂා කර පෙර වර්ෂයන්ට අනුරූපී ලෙස හා එහෙත් එක් මසක වැටුප පමණක් ප්‍රසාද දීමනාවක් ලෙස අමාත්‍යාංශයේ එකඟතාව ඇතිව සංස්ථාවේ නව සභාපති වරයා විසින් මෙම ගෙවීම් කිරීමට කටයුතු යොදන ලදී. මෙය හුදෙක්ම වර්තමාන සභාපතිවරයාගේ මෙම වසරේ නිෂ්පාදන සැලසුම්, නිෂ්පාදන ඉලක්ක අලෙවි විවිධාංගීකරණ වැඩ පිළිවෙළට අනුරූපී ලෙස අලෙවි ඉලක්ක පහසුවෙන් ළඟාකර ගැනීම සඳහා සියලු සේවකයන් අභිප්‍රේරණය කිරීම මුඛ්‍ය පරමාර්ථයෙන්ම සිදු කරන ලදී.

## 3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) වර්ෂ 05ක් හා ඊට වැඩි එකතුව රුපියල් 170,893,188ක් වූ වෙළෙඳ ණයගැති ශේෂය අයකර ගැනීම සඳහා සංස්ථාවෙන් මේ වන විට ක්‍රියාමාර්ග ආරම්භ කර ඇති අතර, ඒ අනුව, 2020. 03. 31 දිනට ශේෂ වෙළෙඳ ණය ප්‍රමාණය රුපියල් 88,969,642.10ක් දක්වා අඩු වී ඇත.

එසේ ම සංඝරාජ මාවත අලෙවිසැලට අදාළ ගණුදෙනුකරුවන් 127 දෙනකු සඳහා ලිපි ගොනු සකස් කිරීම, පරීක්ෂා කිරීම, තහවුරු කිරීම සහ නෛතික කටයුතු සිදුකිරීම ආරම්භ කර තිබේ. ගම්පහ අලෙවිසැලෙහි ණය ගැතියන් සම්බන්ධයෙන් ද නෛතික කටයුතු ආරම්භ කර ඇති අතර ඒ අතරින්, රාජිත පොත්හල - මුදුන්ගොඩ, මෙලී ඉන්ඩස්ට්‍රීස් යන ගණුදෙනුකරුවන් සහ අනුරාධපුර අලෙවිසැලට අදාළ අයි. ජී. ඒ. බණ්ඩාර සහ යශී එන්ටර්ප්‍රයිසස් යන ණයගැතියන් මිය ගොස් ඇති බවට තොරතුරු ලැබී ඇති බැවින් ඉදිරි කටයුතු ගැටලුකාරීවී තිබේ. සහකාර නීති කළමනාකරුගේ මැදිහත්වීම මත නෛතික කටයුතු ආරම්භ කිරීමෙන් අනතුරුව ණයගැතියන් දෙදෙනකු කොටස් වශයෙන් මුදල් ගෙවීම් කරයි.

එසේ ම වර්ෂ 2009 සහ 2013 කාලවකවානුවට අයත් සමහර වෙළෙඳ ණය අයකර ගැනීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය අවම ලිඛිත සාක්ෂි හෝ සාධක සපයා ගත නොහැකි වී තිබේ.

(ආ) පාසල් පෙළ පොත් මුද්‍රණයෙන් හා ලොතරැයි මුද්‍රණයෙන් පිළිවෙළින් රු. 979,237,857/- ක් සහ රු. 268,941,482/- ක් වශයෙන් මුලු අගය රු. 1,248,179,339/- ලෙසට දක්වා ඇත. තවද ආදායම් මූලාශ්‍ර විවිධාංගීකරණය නොකර ආදායම් මූලාශ්‍ර දෙකක් මත පමණක් පදනම්ව කටයුතු කර ඇති බව දන්වා ඇතත්. මීට අමතරව ලිපි ද්‍රව්‍ය අංශයේ වාර්ෂික නිෂ්පාදන ආදායම රු. 187,034,772/- මෙම විගණන විමසුමට ලක්කර නැත. මීට අමතරව වාණිජ මුද්‍රණ ආදායම රු. 182,290,747.36 විගණනයට ලක්කර නැත. මීට අමතරව ජාතික අධ්‍යාපන ආයතනය විසින් ලබාදෙන ලද ගුරු අත්පොත් මුද්‍රණයේ රු. 20,959,304.79 ක ආදායමක් ද ලැබී තිබුණි.

(ඇ) 2020 වර්ෂය සඳහා පාසල් පෙළ පොත් මුද්‍රණය වෙනුවෙන් අමුද්‍රව්‍ය නියමිත පරිදි බලාපොරොත්තු වූ දින වකවානුවලදී නොලැබීම හේතුවෙන් නිෂ්පාදන ඉලක්ක කරා ළඟා වීමට අපහොසත්වීම තුළ දින 02 සිට දින 70 දක්වා කාලයක් ප්‍රමාද වීමට සිදු විය.

(ඈ) 2020 වර්ෂයේ පළමු කාර්තුවේ සිට පැවතුන කොවිඩ් 19 වසංගත තත්ත්වය උඩ සැළසුම් සකස් කර තිබූ පුරප්පාඩු පිරවීම කල්ගත විය. එසේම ජනාධිපතිවරණය හා මහා මැතිවරණය හේතුවෙන් බඳවා ගැනීම් කල්ගත වූ අතර 2020 දෙසැම්බර් මස 01 වන දින සිට සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබූ තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුවිය. 2021 මුල් මාස 03 තුළ පුරප්පාඩු පිරවීම සඳහා සැළසුම් සකස් කර අවසන් වේ.

# ANNUAL
# REPORT

